ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ஸ்ரீலங்கா சீமெந்துக் கூட்டுத்தாபனம

SRI LANKA CEMENT CORPORATION

වාර්ෂික වාර්තාව හා ගිණුම්

வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள

ANNUAL REPORT AND ACCOUNTS

2017

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො. 27, වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ - 02.

2019.03.11

ලේකම්තුමා,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ - 03.

ලේකම්තුමනි,

2017 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව හා ගිණුම් - ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලේඛන සමග 2017 වර්ෂය සඳහා වූ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමු.

අ) 2017 වර්ෂයේ මූල්‍ය වාර්තා
ආ) විගණකාධිපති වාර්තාව
ඇ) යථෝක්ත (ආ) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්

ස්තූතියි.

මෙයට විශ්වාසී,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අත්සන් කළේ,
රියාස් එස්. සාලී,
සභාපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අන්තර්ගතය

	අන්තර්ගතය	පිටු අංකය
01	2017 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	01 – 04
02	ආයතනික තොරතුරු	05 – 06
03	මානව සම්පත් පිරිස් බලය	07
04	ආයතනයේ සභාපතිතුමාගේ වාර්තාව	08
05	2013 - 2017දක්වා වසර 5ක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශනය	09
06	2013 – 2017 දක්වා වසර 5ක් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	10
07	විගණන කමිටුවේ වාර්තාව - 2017	11
08	විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව - 2017	12 – 25
09	2017.12.31ට මූල්‍ය තත්ව ප්‍රකාශනය	26
10	2017.12. 31න් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	27
11	2017.12. 31ට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය	28
12	2017.12. 31ට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	29
13	2017.12.31න් අවසන් වර්ෂයේ මූල්‍ය වාර්තා සඳහා ගිණුම්කරණ සටහන් හා ප්‍රතිපත්ති	30 – 37
14	2017.12.31න් අවසන් වර්ෂයේ ගිණුම්කරණ සටහන් සඳහා සවිස්තරාත්මක සටහන්	38 – 40
15	2017 වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම් සටහන්	41 – 42
16	2017 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම්	43 – 48

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2017 වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1.0 පසුබිම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.
ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි.

කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අප සංස්ථාව 1985 පෙබරවාරි 01වන දින සිට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදි. ඉන් පසු 1997 ජුනි 19 වන දින සිට 2010 අප්‍රේල් මාසය දක්වා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඉන් අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා 2015 පෙබරවාරි මාසය දක්වා එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. වර්තමානය වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

2.0 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

දැක්ම

"ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන පහසුකම් සැපයීම සහ එහි පුරෝගාමියා වශයෙන් මගපෙන්වීම් කිරීම"

මෙහෙවර

"ගුණාත්මකභාවින් යුතු සිමෙන්ති සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන රටේ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි සැපයීම"

ප්‍රධාන ක්‍රියාකාරකම්

1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංස්ථාවේ කාර්යන් හා පරමාර්ථ ලෙස පහත දැ ප්‍රකාශයට පත් කර ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම
- එසේම, 1964 මැයි 11 දිනැති අංක 14033 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් 1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද "සිමෙන්ති නිෂ්පාදනය හා බෙදාහැරීම" වෙනුවට " සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම" ලෙස ඇතුලත් කරන ලද.

ප්‍රධාන පරමාර්ථ

සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම වේ.

එසේම, සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමද සංස්ථාවේ අරමුණු අතර වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910/-ක් 1981දී ආයෝජනය කරන ලද අතර එහි කොටස් ප්‍රාග්ධනයෙන් 62.45%ක හිමිකාරීත්වය දරනු ලැබේ. කොටසක සම මිල රු.10/-ක් වේ. 2009 හා 2010 වර්ෂයන්හිදී සැලකිය යුතු ලෙස මෙම කොටසක මිල උතුරු පළාතේ පැවති අර්බුධකාරී තත්වය පහව යාම හේතුවෙන් රු.34.75ක් දක්වා ඉහළ යන ලදී. 2011 වර්ෂයේදී මෙම කොටසක වටිනාකම රු.26.20ක් දක්වා පහත වැටිණි. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී එහි කොටසක වෙළද පොළ අගය රු.8.20ක් වූ අතර දෙසැම්බර් මාසයේදී එහි අගය රු.7.90ක් විය. මෙම ආයෝජනයට අදාල ප්‍රතිලාභ මෙතෙක් සංස්ථාවට ලැබී නොමැත. 2010 අප්‍රේල් මාසයේ සිට 2016 පෙබරවාරි 25 දක්වා සංස්ථාව හා සමාගම එකම අධ්‍යක්ෂ මණ්ඩලයක පාලනය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. මේ වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගම අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් යටතේ වෙන වෙනම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම ආයොජනයට අදාලව 1999දක්වා ප්‍රතිලාභ සංස්ථාවට හිමිවුනි. නැවත 2014 වර්ෂයට අදාලව රු.1,728,000/-ක් ලාභාංශ වශයෙන් 2015 වර්ෂයේදී හිමි විය.

3.0 වර්තමාන තත්වය

සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව හා රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටා තිබූ කඩදාසි මළු ඒකකයේ අයිතිය මහාභාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතු වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පමණි. එම කර්මාන්තශාලාවද උතුරේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මස සිට වසා දමා ඇති අතර එම භූමිය මේ වන විටත් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පවතී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි ඉඩම් නිදහස් කරගැනීමටත් නැවත එහි සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමටත් කිහිපවිටකදීම උත්සාහ කලද එය නිෂ්පල විය. එසේම, ආරක්ෂක අංශයන්ගේන් මෙම ඉඩම් නිදහස් කරගැනීමෙන් අනතුරුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම ඇතුලත් වාර්තා සකස් කර ආදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

සිමෙන්ති නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බැවින් සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වූ අතර 1997 වර්ෂයේ සිට කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීමේ නිරත විය.

2016 වර්ෂයේදීද මහා භාණ්ඩාගාරය විසින් හදුන්වාදෙනු ලැබූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 36 දෙනෙකු 2016.07.31 දිනට විශ්‍රාම යන ලදි. ඊට අදාළව රු මිලියන 31.94ක් මහා භාණ්ඩාගාරය විසින් වන්දි හා විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම් සඳහා ලබා දෙන ලදි.

(අ) සිමෙන්ති ආනයනය හා අලෙවිය :

අවම මිලකට ඉහළ ගුණත්වයෙන් යුතු සිමෙන්ති අවසන් පාරිභොගිකයා වෙත සැපයීම සඳහා 2008 වර්ෂයේ සිට සිමෙන්ති ආනයනය කර "කන්කේසන්" වෙළඳ නාමය යටතේ අලෙවි කිරීම සිදු කරන ලදි.

2013 සහ 2014 වර්ෂයන්හිදී සංස්ථාව විසින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 20,300ක් සහ මෙට්‍රික් ටොන් 18,900 ක් ආනයනය කර ඇත. එසේම, සිමෙන්ති මෙට්‍රික් ටොන් 1,540ක් හා මෙට්‍රික් ටොන් 3,815ක් පිළිවෙලින් 2015 හා 2016 යන වර්ෂ වලදී ආනයනය කර ඇත.

2017 වර්ෂයේදී සිමෙන්ති මෙට්‍රික් ටොන් 980ක් පමණක් ආනයනය කර අතර සිමෙන්ති අලෙවි කිරීම සඳහා පළපුරුදු සේවකයින් නොමැති වීම සහ මූල්‍යමය අපහසුතා මත සිමෙන්ති ආනයනය කර විකිණීම් කටයුතු තාවකාලිකව නවතා ඇත.

<u>සිමෙන්ති අලෙවිය</u>

වර්ෂය	2017	2016	2015
ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	980	4,002	2,780
වටිනාකම (රු.මිලියන)	12.66	60.15	37.87

(ආ) **<u>කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීම :</u>**

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම 1997 ඔක්තෝබර් මාසයේදී සංස්ථාව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ ආරම්භ කර ඇත. මෙමගින් ප්‍රධාන වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන වලට කොන්ක්‍රීට් රුහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි නිරත වී ඇත.

2009 වර්ෂයේදී කොන්ක්‍රීට් රුහැන් ආධාරක කණු නිෂ්පාදනයට අමතරව කොන්ක්‍රීට් ගල්, තලාංද පදිකා වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදි නිෂ්පාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්වවිද්‍යාලය සහ සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කිරීම ආරම්භ කරන ලදි.

2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 16,431ක් සිදු කර ඇත.

එසේම 2013 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 2,003ක්, 1,674 ක් සිදු කර ඇත. 2015 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 191ක්, පන්තල් කණු 832ක් හා කොන්ක්‍රීට් ගල් 71,771ක් නිෂ්පාදනය කර ඇත. එසේම, 2016 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 168ක්, වැටවල් සඳහා වූ කණු 224ක්, ආර්.සී.කණු 95ක් හා කොන්ක්‍රීට් ගල් 30,122ක් නිෂ්පාදනය කර ඇත.

<u>කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය</u>

වර්ෂය	2017	2016	2015
කොන්ක්‍රීට් කණු	-	304	-
වැටවල් සඳහා වූ කණු	4	253	391
ආර්.සී.කණු	145	169	419
කොන්ක්‍රීට් ගල්	-	46,907	54,805
වටිනාකම (රු.මිලියන)	**1.13**	**4.07**	**2.69**

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අංගනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 02 දෙදෙනෙකු 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය සඳහා එම අංගනයේ සේවකයින් 02කු පමණක් සේවයේ නියුතු වේ.

(ඇ) ආයතනයේ කාර්්‍යසාධනය ඉහළ නැංවීම පිළිබඳ මධ්‍යකාලීන ක්‍රියාමාර්ග :

සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. ඒ තුලින් සංස්ථාව ස්ථායී හා කාර්්‍යක්ෂම මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා එහි පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම ප්‍රතිව්‍යුහගත කල යුතු ආයතන ලෙස හදුනාගෙන ඊට අදාළ කටයුතු සිදු වෙමින් පවති. එසේම, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලංකා සිමෙන්ති සමාගම සමග ඒකාබද්ධ කිරීමට කටයුතු සිදු වේ. 2016 වර්ෂයේ පෙබරවාරි මස සිට මෙම ආයතන දෙක වෙන වෙනම වූ අධ්‍යක්ෂ මණ්ඩල යටතේ කළමණාකරණය වේ.

4.0 ලාභදායීත්වය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව , 2011 වර්ෂයේදී රු.මිලියන 2.6ක ලාභයක් උපයා ඇත. 2012, 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙළින් රු. මිලියන 75ක්, රු. මිලියන 424ක් හා රු. මිලියන 13ක් ලෙස අලාභ දරා ඇත.

නැවත, 2015 වර්ෂයේදී රු.4.34ක ප්‍රකාශිත ගණකාධිකරණ ලාභයක් උපයාගෙන ඇත. 2016 වර්ෂයේ ප්‍රකාශිත ගණකාධිකරණ ලාභය රු. 31,700,843/-කි.

2017 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව රු.18,562,875/- ක බදු පෙර ලාභයක් උපයා ඇත. එය පෙර වසර හා සැසදීමේදී 30.62% වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. සිමෙන්ති ආනයනය කර බෙදාහැරීම නවතා දැමීම මීට සෘජුව බලපා ඇත. මෙම වර්ෂය තුල 40%ක උපචිත බැංකු ණය කපාහැරීමක් ලබාගත් අතර එහි වටිනාකම රු.16,144,188/-. මෙම වසරේ බදු පෙර ලාභය රු. 15,612,753/- ක් වන අතර බදු පසු ලාභය රු. 12,703,686/-කි.

5.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්යභාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාව කන්කසන්තුරේ කර්මාන්තශාලාව වන අතර යුධමය වාතාවරණය හේතුවෙන් එය 1990 ජුනි මස වසාදැමීමෙන් පසු මේ වන තුරු සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැත. එසේම එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ පුරෝකථනයන්ද සිදුකල නොහැක. නමුත්, නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට අදාල වාර්තා සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.

මෙම කන්කසන්තුරේ කර්මාන්තශාලාව සහිත භූමිය නැවත සිමෙන්ති සංස්ථාවට භාරදෙන ලෙස ඉල්ලීම් කර තිබුනද වර්තමානය වන විටත් එය භාර දීමට ශ්‍රී ලංකා යුධ හමුදාව කටයුතු කර නොමැත. මෙම භූමිය සංස්ථාවට මුදා හැරීමෙන් අනතුරුව ඊට යෝග්‍ය සංවර්ධන කටයුත්තක් ආරම්භ කල හැකිවේ.

කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශයේදී 2016.10.20වන දින පැවති “2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබඳ” රැස්වීමේදී ගනු ලැබූ තීරණ 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය මඟින් දැනුවත් කල අතර ඒ අනුව අප සංස්ථාව සතු කොල්ලුපිටිය,මන්නාරම, පුත්තලම හා කන්කසන්තුරේ පිහිටා ඇති ඉඩම් සඳහා යෝග්‍ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

සුදුසු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා සිදුවෙමින් පවතී.

එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ජනිත වන ආදායම් මනා ලෙස කළමණාකරණය කිරීමටත්, ඒ තුලින් සංස්ථාවේ මූල්‍ය තත්වය ශක්තිමත් මට්ටමකට ගෙන ඒමට හා සංස්ථාව ස්ථාවර මට්ටමකට ගෙන ඒමටත් උත්සාහ කරනු ලැබේ.

6.0 සේවය ඇගයීම

2017 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් මගපෙන්වීම් සම්බන්ධව කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා හට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර සංස්ථාවට ලබාදුන් සහයෝගය වෙනුවෙන් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, ප්‍රමිත ආයතනයේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, රාජ්‍ය බැංකුවල, අනෙකුත් රජයේ ආයතන වල හා සිමෙන්ති නිෂ්පාදන හා අලෙවි කටයුතුවල නියුතු ආයතන වල සේවයේ නියුතු සියලු නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

එසේම, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව පිළිබඳ තොරතුරු

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දුරකථන අංක : 0112 440 201 , 0112 440 203 හා 0112 440 205
ෆැක්ස් අංක : 0112 448 866

සිමෙන්ති කර්මාන්තශාලාව

කන්කේසන් සිමෙන්ති කර්මාන්තශාලාව, කන්කසන්තුරේ.

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අංගනය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, උරුම්පිරායි, යාපනය.
දුරකථන අංක : 0213 215 340

බැංකුකරුවෝ

ලංකා බැංකුව, මහජන බැංකුව

විගණකවරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව, අංක.306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

පරිපාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම

ප්‍රධාන කාර්යාලය

ලංකා සිමෙන්ති සමාගම, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

දුරකථන අංක : 0112 447 746, 0112 399 243
ෆැක්ස් අංක : 0112 447 541

සිමෙන්ති කර්මාන්තශාලාව

සිමෙන්ති කර්මාන්තශාලාව, කිරිමලේ පාර, කන්කසන්තුරේ.

සිමෙන්ති ගබඩාව

නො.472, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 02.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2017 වර්ෂයේ පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් කළමණාකරණ මණ්ඩලයේ කටයුතු කර ඇත.

01. හුසේන් අහමඩ් බහිලා මහතා	සභාපති	2015.02.13	සිට
02. එස්. අබිඩීන් එහියා මහතා	කළමණාකරණ අධ්‍යක්ෂ	2016.02.16	සිට
03. ඩබ්.ඩී.ජානක මහතා	අධ්‍යක්ෂ	2015.02.25	සිට
04. එම්.එස්.එම්.කබීර් මහතා	අධ්‍යක්ෂ	2015.03.18	සිට
05. එන්.එම්.මුනාවර් මහතා	අධ්‍යක්ෂ	2015.03.31	සිට
06. ඒ.රෂීක් මහතා	අධ්‍යක්ෂ	2015.04.30	සිට
07. ඩී.එස්.කොස්තා මහත්මිය	මහාභාණ්ඩාගාර නියෝජිත	2015.10.30	සිට
08. ටී.ඔ.ආර්.වනිගරත්න මහතා	අමාත්‍යාංශ නිරීක්ෂක	2015.03.10	සිට
09. කේ.එන්.ෆෙනැන්ඩෝ මහත්මිය	අමාත්‍යාංශ නිරීක්ෂක	2017.12.26	සිට

2018 වර්ෂයේ පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් කළමණාකරණ මණ්ඩලයේ කටයුතු කර ඇත.

01. එම්.රියාස් සාලි මහතා	සභාපති	2018.06.25	සිට
02. එස්. අබිඩීන් එහියා මහතා	කළමණාකරණ අධ්‍යක්ෂ	2018.07.25	සිට
03. එම්.එස්.එම්.කබීර් මහතා	අධ්‍යක්ෂ	2018.07.25	සිට
04. එන්.එම්.මුනාවර් මහතා	අධ්‍යක්ෂ	2018.07.25	සිට
05. ඒ.රෂීක් මහතා	අධ්‍යක්ෂ	2018.07.25	සිට
06. ඩී.එස්.කොස්තා මහත්මිය	මහාභාණ්ඩාගාර නියෝජිත	2018.07.25	සිට
07. එල්.ජී.නිලංග ඩී. සෝමපාල	අමාත්‍යාංශ නිරීක්ෂක	2018.07.25	සිට

ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව

01. එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක	ගණකාධිකාරී
02. ඊ.එස්.චාන්දනී	පිරිස් නිලධාරී

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2017.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

වර්ගය	ජ්‍යෙෂ්ඨ කළමණාකරන	මධ්‍ය කළමණාකරන	කණිෂ්ඨ කළමණාකරන	කළමණාකරන සහකාර	ප්‍රථමික මට්ටම	එකතුව
ප්‍රධාන කාර්‍යාලය	02	01	01	04	07	15
කොන්ක්‍රීට් අංගනය	-	-	-	-	01	01
එකතුව	**02**	**01**	**01**	**04**	**08**	**16**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සභාපතිගේ වාර්තාව

2015 වර්ෂයේ පෙබරවාරි මස දක්වා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර ඉන්පසු කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය විසින් සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ 2017 වර්ෂයේ අප්‍රේල් මස දක්වා නිරත විය.

මෙම වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විශාල අභියෝග රැසකට මුහුණ දෙන ලදි. එසේම, 2017 වර්ෂයේදී රු.15,130,564/-ක ආදායමක්, බදු පෙර ගණකාධිකරණ ලාභය ලෙස රු.18,174,716/-ක්, බදු පසු ලාභය ලෙස රු.12,703,686/- හා විස්තීරණ ආදායම් හා වියදම් ඇතුලත් ගණකාධිකරණ ලාභය ලෙස රු.12,703,686/- ක් වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු ගුණාත්මක බවින් හා ආර්ථික වටිනාකමින් යුතු හුණුගල් , මැටි සහ ඉල්මනයිට් වැනි අමුද්‍රව්‍ය සහිත ඉඩම් සඳහා නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ආදායම් ඉපැයීම සම්බන්ධව අවධානය යොමුකර ඇත. එසේම, එම ව්‍යාපෘති තුලින් සංස්ථාවට දිගුකාලීන වාසි අත්පත් කරගැනීමට බලාපොරොත්තු වේ.

තවදුරටත් , ව්‍යාපාරික කටයුතුවල නිරත වීම තුලින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වඩාත් ස්ථායී හා කාර්යාක්ෂම තත්වයට පත්කිරීමට කටයුතු කරනු ලැබේ.

අත්සන් කලේ,

හුසෙන් අහමඩ් බහිලා,
සභාපති,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මූල්‍ය තත්ව ප්‍රකාශනය

20143 සිට 2018 දක්වා වූ වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට

			පුනප්‍රකාශිත		
	2018	**2017**	**2016**	**2015**	**2014**
වත්කම්	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**	**රු.'000**
ජංගම නොවන වත්කම්					
දේපල පරියත හා උපකරණ		1,590	3,887	4,173	779,317
ආයෝජන වත්කම්		796,950	773,700	773,700	-
දිර්ඝකාලීනව ලැබිය යුතු දෑ		-	-	757,224	757,224
ආයෝජනයන්		624,063	624,063	862,458	721,589
මූල්‍ය වත්කම්		5,689	5,162	35,469	33,428
		1,428,292	**1,406,812**	**2,433,024**	**2,291,558**
ජංගම වත්කම්					
තොගය		1,241	3,099	8,594	18,933
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ		74,469	89,212	80,551	96,247
ඉදිරියට කල ගෙවීම්		-	-	-	-
මුදල් හා මුදල් සමාන දෑ		9,158	13,687	8,743	2,076
		84,868	**105,998**	**97,838**	**117,256**
මුළු වත්කම්		**1,513,160**	**1,512,810**	**2,530,863**	**2,408,814**
හිමිකම් හා වගකීම්					
හිමිකම්					
කොටස් ප්‍රාග්ධනය		966,971	966,971	966,971	966,971
පොදු සංචිතය		9,997	9,997	9,997	9,997
ප්‍රත්‍යාගණිත සංචිත		561,203	536,119	536,119	713,619
රදවාගත් ඉපැයුම්		(197,585)	(210,289)	515,234	333,315
විකිණීම සඳහා වන දැහි සංචිත		(465,956)	(465,956)	(227,560)	(368,430)
		874,630	**836,842**	**1,800,761**	**1,655,474**
ජංගම නොවන වගකීම්					
දිගුකාලීන වගකීම්		492,426	492,426	500,426	519,303
විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම්		3,796	3,298	18,697	19,394
		496,222	**495,724**	**519,123**	**538,698**
ජංගම වගකීම්					
වෙළඳ හා ගෙවිය යුතු දෑ		42,317	46,502	81,305	93,227
පොළී ගෙවිය යුතු ජංගම වගකීම්		97,794	97,793	101,020	68,515
උපචිත බැංකු ණය පොළී		2,198	21,768		
මුදල් හා මුදල් සමාන දෑ		-	14,181	28,653	52,900
		142,308	**180,244**	**210,978**	**214,642**
මුළු හිමිකම් එ෮ා වගකීම්		**1,513,160**	**1,512,810**	**2,530,863**	**2,408,814**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

විස්තීරණ ආදායම් හා රදවාගත් ඉපැයුම් ප්‍රකාශනය

2014 සිට 2018 දක්වා දෙසැම්බර් 31 න් අවසන් වර්ෂ සඳහා

	2018 රු.'000	2017 රු.'000	පුනප්‍රකාශිත 2016 රු.'000	2015 රු.'000	2014 රු.'000
ආදායම්		15,130	64,221	40,571	285,657
විකුණුම් පිරිවැය		(16,215)	(66,525)	(50,781)	(280,878)
දළ ලාභය/(අලාභය)		**(1,084)**	**(2,304)**	**(10,211)**	**4,779**
වෙනත් ආදායම්		56,555	91,542	60,043	34,233
බෙදාහැරීම් වියදම්		(272)	(292)	(1,198)	(2,951)
පරිපාලන වියදම්		(20,524)	(41,172)	(30,461)	(29,211)
මූල්‍ය වියදම්		(16,501)	(15,704)	(15,334)	(20,642)
බදු පෙර ලාභය/(අලාභය)		**18,174**	**32,070**	**2,839**	**(13,793)**
බදු පිරිවැය		(2,877)	(369)	(255)	-
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)		586	(995,620)	140,870	43,345
පෙර වර්ෂ ගැලපීම්		(3,180)	-	-	-
බදු පසු ලාභය		**12,703**	**(963,181)**	**143,454**	**(29,552)**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

විගණන කමිටුවේ වාර්තාව - 2018

සංස්ථාවේ විගණන කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතවේ. කර්මාන්ත හා වාණිජ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකතුමා හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරයෙකුද නිරීක්ෂකවරුන් ලෙස ඊට සහභාගි වේ.

විගණන කමිටුවේ සභාපති ලෙස ඩී.එස්.කොස්තා මහත්මිය කටයුතු කරනු ලබයි. එම්.එස්.එම්.කබීර් මහතා සහ එන්.එම් මුනාවර් මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලැබේ.

විගණන කමිටුවේ වගකීම් හා කාර්යභාරය පහත පරිදි වේ.
අ. වාර්ෂික වාර්තාවන්, ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා අනෙකුත් අදාල නීතිමය තත්වයන්ට අනුකූල වන ලෙස සකස්කර තිබේද යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම.

ආ. අදාල නීති, රෙගුලාසි සහ අනුමත චක්‍රලේඛයන්ට අනුකූලව සංස්ථාව කටයුතු කර තිබේද සහ එසේ අනුකූල නොවන අවස්ථාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දී දැනුවත් කිරීම.

ඇ. අභ්‍යන්තර සහ බාහිර විගණන වාර්තා සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාවේ උපදෙස් සලකා බැලීම හා ඒ පිළිබඳ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපකරෙ කිරීම.

ඈ. අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාවට හඳුන්වා දීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

සමාලොචිත වර්ෂයේ විගණන කමිටුව විසින් වෙන්ත් කාර්යයන් සමග පහත සඳහන් ක්‍රියාකාරකම් වලද යෙදුනි.

- විගණනය නොවූ මාසික මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණනය වූ වර්ෂයට අදාල මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණක වාර්තා පරික්ෂා කිරීම හා කළමණාකරණය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ දැනුවත් කිරීම.

අත්සන් කලේ,

ඩී.එස්.කොස්තා,
සභාපති
විගණන කමිටුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : ට්සීඑම්/ඒ/එස්එල්සීසී/53/2017/එජ්ජ්

මබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2018 සැප්තැම්බර් 05 දින

සභාපති,

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 ජූලි 17 දින නිකුත් කර ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතියෙන් අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සංස්ථාව විසින් 1981 වර්ෂයේදී ලංකා සිමෙන්ති සමාගමේ රු.10 යේ කොටස් 108,361,891 ක රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබූ අතර, මෙම කොටස්වල වර්තමාන වෙළඳපොල වටිනාකම රු.617,662,779 ක් විය. ඒ අනුව සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ කොටස් හිමිකමෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1964 අප්‍රේල් 17 දිනැති අංක 14012 දරන ගැසට් නිවේදනය මඟින් කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාව සහ ඉඩම සංස්ථාව වෙත නීත්‍යානුකූලව පවරා තිබුණද, එම වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලවි හි පිහිටි අච්චවිල්ලු නැමති සංස්ථාව සතු අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 69 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි සංස්ථාව සතු අක්කර 5352 ක් වූ අරුවක්කාලු හුණුගල් නිධිය වසර 50 ක කාලයකට හොල්සිම් ලංකා සමාගම වෙත (වර්තමානයේ සියැම් සිටි සමාගම) බදු දී තිබුණි. සමාලෝචිත වර්ෂය වන විටත් සංස්ථාවේ ප්‍රධාන ආදායම වූ මෙම වත්කම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයට අදාළ ගෙවිය යුතු එකතුව රු.255,967 ක ආර්ථික සේවා ගාස්තු බදු මුදල හා 2016 වර්ෂයේ දෝෂ සහිත ගණනය කිරීම් හේතුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු.129,211 ක ආර්ථික සේවා ගාස්තු ගෙවීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම්දීමකින් තොරව ලෙජර් ගිණුම් වලින් එකිනෙකට හිලව් කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු බදු ගිණුමේ ශේෂය රු.129,211 කින් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඉ) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් 1990 ගිණුම් වර්ෂයට අදාළව නිකුත් කරන ලද රු.335,249 ක විගණන ගාස්තු ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර ගෙවීමට කටයුතු කර නොතිබුණි. එසේම 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා විගණන ගාස්තු වෙන් කිරීම 2015 වර්ෂය පදනම් කරගෙන සිදු කිරීම නිසා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා එකතුව රු.571,875 ක් අඩුවෙන් වෙන් කිරීම් කර තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ගිණුම් විෂයය	ඉදිරිපත් නොකළ සාක්ෂි
(අ) 2008 වර්ෂයේ සිමෙන්ති මෙට්‍රික් ටොන් 8600 ක් ආනයනය කිරීම.	මුළු සිමෙන්ති ආනයනයට අදාළ ගෙවීම් වවුචර්, ක්‍රමවත්ව නඩත්තු කළ ලිපිගොණු සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ.
(ආ) පරිගණක හා කාර්යාල උපකරණ	සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොග ඌනතා භාණ්ඩ 32 ක පිරිවැය වටිනාකම.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.74,469,339 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය තුළ වසර 1 ත් වසර 3 ත් අතර එකතුව රු.11,510,027 ක්ද, වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.58,179,621 ක්ද වූ අතර මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.42,317,003 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුළ වසර 1 ත් වසර 3 ත් අතර ණය ශේෂවල එකතුව රු.2,851,642 ක්ද වසර 3 ට වැඩි ණය ශේෂවල එකතුව රු. 35,896,742 ක්ද වූ අතර, මෙම හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට පියවරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.12,854,883 ක් වූ පූර්ව වර්ෂ වලට අදාළ එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු එකතුව රු.8,410,618 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් මෙම වාර්තාවේ දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 751	රෙගුලාසිය ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඈ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	
(I) 05 (1)(අ) වගන්තිය	අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාරය තුළ ඇති ශක්තීන් හා දුර්වලතා ඇගයීමට ලක් කරමින් සැලසුම් යාවත්කාලීන කළ යුතු වුවත්, සපුරාගත නොහැකි වූ අරමුණු සහ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අරමුණු පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර සංස්ථාවේ සැලසුම් යාවත්කාලීන කර නොතිබුණි.
(II) 05 (1)(ඇ) වගන්තිය	කාලීනව ලඟා කරගත යුතු ඉලක්ක ස්ථාපිත කිරීම හා ඒවා සපුරා ගැනීමේ වගකීම මෙහෙයුම් මට්ටම දක්වා බෙදාහැරිය යුතු වුවත්, වාර්ෂිකව ලඟා කරගත යුතු ඉලක්ක සහ එම අරමුණු සඳහා වගකීම බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
9.4 වගන්තිය	සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව සේවකයින් දෙදෙනෙකු 2017 අගෝස්තු 01 දින සිට සිමෙන්ති සමාගම වෙත මුදා හැර තිබුණි.
(ඉ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය	අත්තිකාරම් පියවීම නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවස්ථා 13 කදී ලබා දුන් එකතුව රු.240,946 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන දිනටද පියවීම් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,298,106 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.31,700,843 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,402,737 ක අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ විකුණුම් රු.48,489,811 කින්, එනම් සියයට 76 කින් අඩුවී තිබීම සහ අනෙකුත් ආදායම රු.34,986,914 කින් එනම් සියයට 38 කින් අඩුවී තිබීම ඉහත පරිදි ශුද්ධ ලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂවල ඌනතාවයක් පැවතියද නැවත 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂිකව අතිරිත්කයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැළපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.338,370,664 ක සෘණ අගයක් වූ සංස්ථාවේ දායකත්වය 2014 වර්ෂයේ සිට ධන අගයක් බවට පත් වුවද, වාර්ෂිකව අඩුවී සමාලෝචිත වර්ෂය වන විට රු.37,026,792 ක ධන අගයක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 වගන්තිය සහ 5 (2) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විය යුතු මානව සම්පත් සංවර්ධන සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම යන සැලසුම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්ක යථාර්තවාදී සහ අත්පත් කරගත හැකි විය යුතු වුවත්, ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර සේවකයින් ඉවත් කළ ආයතනයකට ප්‍රායෝගිකව ඉටු කළ නොහැකි අරමුණු හා ඉලක්කයන් සංස්ථාවේ සැලැස්මේ දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) උක්ත චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මේ ඇතුළත් විය යුතු වූ ආයතනයේ සංවිධාන ව්‍යුහය, මානව සම්පත්, කළමනාකරණ දක්ෂතා සහ තාක්ෂණික දැනුම, ආයතනය සතු වර්තමානයේ පවතින සම්පත් සහ පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය යන ප්‍රධාන කරුණු සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සංස්ථාවේ ප්‍රධාන අරමුණු වුවත්, පසුගිය යුධමය වාතාවරණයෙන් පසුව කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනය නතර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට සිමෙන්ති බෑග් ආනයනය කර අලෙවි කිරීම සහ කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීමද සම්පූර්ණයෙන් නතර කර තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 ඔක්තෝබර් 20 දිනැති අංක පීඊ/ආර්ඊඑස්/වීආර්එස් දරන ලිපිය අනුව ස්වේච්ඡා විශ්‍රාම වන්දි ලබාදීමෙන් පසුව සංස්ථාව විසින් ඉතිරි සේවකයින් යොදවා බදු කුළිය නිර්ණය, කන්කසන්තුරේ ඇතුළු ඉතිරි ඉඩම් සඳහා බදු කුලීකරුවන් සොයා ගැනීම, බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම ආදී කටයුතු සිදුකර එම ආදායමින් සේවක ගෙවීම් ගෙවා ඉතිරිය රජයට ප්‍රේෂණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව ඒ අනුව ක්‍රියා කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයට සාපෙක්ෂව 2015 වර්ෂයේදී සංස්ථාව විසින් අලෙවිය සඳහා සිමෙන්ති මිලදී ගැනීම සියයට 91 කින් පහළ බැස තිබූ අතර, එම අඩුවීම 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 90 ක් විය. 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අලෙවිය සියයට 77 කින් එනම්, රු.46,146,262 කින් අඩුවී තිබුණි. 2017 මුල් අර්ධ වර්ෂයෙන් පසු සිමෙන්ති ආනයනය කර අලෙවි කිරීම නතර කර දැමීම මෙයට හේතුවී තිබුණි.

(ඈ) කන්කසන්තුරේ කොන්ක්‍රීට් නිෂ්පාදන සහ අලෙවි අංශයේ මුළු අලෙවි ආදායමට වඩා වියදම් දැරීමට සිදුවීම නිසා දිගින් දිගට අලාභ ලබා තිබූ අතර, පසුගිය වසර පහ තුළදී කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවිය 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය අතර රු.25,620,000 ක සිට රු.1,128,281 ක් අතර පරාසයක උච්ඡාවචනය වෙමින් පැවතුණි. 2016 වර්ෂයට

සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කොන්ක්‍රීට් කණු අලෙවිය සියයට 72 කින් පහළ බැස තිබූ අතර, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම නතර කර දැමීම ඒ සඳහා හේතුවී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ බැංකු ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොත අනුව බැංකු ශේෂය රු.608,359 ක් වුවත්, ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශන අනුව එම බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.2,156,449 ක් වීම නිසා රු.1,548,089 ක වෙනසක් නිරීක්ෂණය විය. 2008 වර්ෂයට පෙර සිට පැවත එන මෙම වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ කළමනාකරණය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය බැංකු මඟින් ලබාගත් ගෙවිය යුතු මුළු බැංකු ණය වටිනාකම රු.97,793,352 ක් විය. එම බැංකු ණය සඳහා සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද මුළු බැංකු ණය පොළිය රු.19,880,338 ක් වූ අතර, සංස්ථාවේ අකාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය නිසා විශාල මූල්‍ය පිරිවැයක් වාර්ෂිකව රාජ්‍ය බැංකු සඳහා ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසුව සංස්ථාව සතු ලංකා සිමෙන්ති සමාගමේ සියයට 62.45 ක කොටස්, කොටස් වෙළඳපළේ විකුණා රජයට ආදායමක් ලබාදීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016 ඔක්තෝබර් 20 දිනැති අංක පීඊ/ආර්ඊඑස්/වීආර්එස් දරන ලිපිය අනුව උපදෙස් ලබාදී තිබුණද 2018 ජූලි දක්වාම කළමනාකරණය විසින් ඊට අදාළ පියවර ගෙන නොතිබුණි.

4.3 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව සහ ගොඩනැගිලි සංකීර්ණය පිහිටි අක්කර 741 ක් වූ ඉඩමෙන් අක්කර 297 ක් ගැසට් නිවේදනයක් මඟින් සංස්ථාව වෙත පවරා තිබුණද ඉතිරි අක්කර 444 ක ඉඩම්වල හිමිකාරීත්වය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී. මෙම ඉඩම, කර්මාන්තශාලාව සහ ගොඩනැගිලි අධි ආරක්ෂිත කලාපයේ යුධ හමුදාව භාරයේ නිෂ්ක්‍රිය වත්කම් ලෙස පැවතුණි.

(ආ) 1967 ජූලි 12 දිනැති අංක 14756/7 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ අංක 288 දරන ඔප්පුව මඟින් කොල්ලුපිටියේ පිහිටි පර්චස් 89.9 ක ඉඩම සංස්ථාවට හිමිව් තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට තක්සේරු වටිනාකම රු.735,000,000 ක් වූ මෙම ඉඩම, 2008 වර්ෂයේ සිට රාජ්‍ය බැංකුවකට උකස් කර ණය ලබාගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ණය ශේෂය රු.97,793,352 ක් විය. ගාළු පාරට යාබදව පිහිටි මෙම ඉඩම, වසර 50 ක කාලයක් තුල ඵලදායී කාර්යයකට යොදා නොගෙන නිෂ්ක්‍රිය වත්කමක් ලෙස පැවතුණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලවි හි පිහිටි අට්ටවිල්ලු නැමති සංස්ථාව සතුව පවතින අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 159 ක් වසර 40 ක සිට ඵලදායී කාර්යයකට යොදාගෙන නොතිබුණි.

4.4 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1981 වර්ෂයේදී ආරම්භ කරන ලද සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 62.45 ක හිමිකාරීත්වයක් සංස්ථාව සතු වුවද, එම ආයෝජනය සඳහා පසුගිය වසර 26 ක කාලය තුළ කිසිඳු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලබා දී නොතිබුණි.

(ආ) අලෙවි කිරීම සඳහා ආනයනය කරන ලද එකතු වටිනාකම රු.798,917 ක් වන කිලෝග්‍රෑම් 50 සිමෙන්ති බෑග් 1,128 ක් කල් ඉකුත් වීම නිසා රු.350,000 කට අලෙවි කිරීම හේතුවෙන් සංස්ථාවට රු.448,937 ක අලාභයක් සිදුවී තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ කාර්ය මණ්ඩලය 2016 ජුලි 31 දින සිට ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් මඟින් විශ්‍රාම ගොස් තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට තත්‍ය කාර්ය මණ්ඩලය 14 දෙනෙකුට සීමා වී තිබුණි. ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසුව සංස්ථාවේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සීමෙන්ති සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සිමෙන්ති සංස්ථාව විසින් නිසියාකාරව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතනය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත්

වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සිමෙන්ති සංස්ථාවේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

6.2 අභ්‍යන්තර විගණනය

2016 ජූලි මාසයේදී ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර සංස්ථාවේ සේවකයන් විශ්‍රාම යැවීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ අභ්‍යන්තර විගණනය සඳහා කිසිම නිලධාරියෙකු සේවයේ යොදවා නොතිබූ අතර, වර්ෂය තුළ සංස්ථාවේ අභ්‍යන්තර විගණනයට අදාළ කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි.

6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.3.1 ප්‍රසම්පාදනයන්

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව, තාක්ෂණික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා සංස්ථාවට අයත් අරුවක්කාලු ඉඩම, පෞද්ගලික සමාගමකට ලබාදී තිබුණි. මෙම තාක්ෂණික අධ්‍යයනය පිළිබඳව සංස්ථාව සහ පෞද්ගලික සමාගම අතර, ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි.

6.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 09 ක අයවැයගත හා තත්‍ය වියදම් වල සියයට 23 සිට සියයට 229 දක්වා විචලනයන් පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අළෙවි නියෝජිත ධූරය ප්‍රදානය කිරීමේදී ණය පදනම මත ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැදුම්කරයක් ලබා නොගැනීම, ණය ලබාදීමේදී සහ ණය එකතු කිරීමේදී කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂම

ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකතුව රු.52,506,824 ක් වූ ණය ශේෂය අය කරගෙන නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් රු.1,200,000 කට මිලදී ගන්නා ලද ගාල්ල, උණවටුන, කැස්බෑපාන පිහිටි අක්කර 06 ක් වූ ඉඩම කළමනාකරණය විසින් ඵලදායී කාර්යයක යොදා නොගැනීම නිසා ගාල්ල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සුනාමියෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කර තිබුණි. සංස්ථාව විසින් එම ඉඩම සඳහා වන්දි මුදල් ලබා ගැනීමට ගාල්ල දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

(ඇ) සංස්ථාවට අයත් පුත්තලම පිහිටි අක්කර 5352 ක අරුවක්කාලු හුණුගල් නිධිය වසර 50 ක කාල සීමාවක් සඳහා හොල්සිම් ලංකා සමාගමට බදු මුදල නොවෙනස්වන බදු ගිවිසුමක් යටතේ ලබා දී තිබුණි. 2011 අගෝස්තු 16 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදිද මෙම බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් ලබාදී වසර 06 කට වැඩි කාලයක් ගත වුවත් එම බදු ගිවිසුම සංශෝධනය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් වැංකි සංකීර්ණය ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව 2010 වර්ෂයේ සිට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ පරිහරණය සඳහා ලබාදී තිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ස්ථාවර වත්කම් පාලනය	ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම සහ සමීක්ෂණ මණ්ඩල පත්කර වත්කම් සමීක්ෂණය ප්‍රමාද කිරීම.

(ආ) ගබඩා පාලනය	සිමෙන්ති තොග නඩත්තු කිරීම, ගබඩා කිරීම සහ තොග වාර්තා පවත්වා ගැනීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකිරීම.
(ඇ) අභ්‍යන්තර පාලනය	අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදී ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කර පාලනයක් පවත්වා නොගැනීම, අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර පවත්වා නොගැනීම.
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය	අයවිය යුතු ණය ශේෂ අයකර නොගැනීම, ණය අලෙවියට අදාළ වාර්තා නිසි පරිදි නඩත්තු නොකිරීම සහ ණයහිමියන් ගෙවා නිරවුල් නොකිරීම.
(ඉ) අභ්‍යන්තර විගණනය	අභ්‍යන්තර විගණන අංශයක් මගින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
මූල්‍ය තත්ව ප්‍රකාශනය
2017 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2017 රු.	2016 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**03**	1,589,512	3,886,969
ආයෝජන දේපල	**04**	796,950,000	773,700,000
දිගුකාලීනව ලැබිය යුතු දෑ	**05**	-	-
වෙනත් ආයෝජනයන්	**06**	629,752,312	629,225,138
		1,428,291,824	**1,406,812,107**
ජංගම වත්කම්			
තොගය	**07**	1,241,757	3,099,678
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**08**	74,469,339	89,212,053
මුදල් හා මුදල් සමාන දෑ	**09**	9,157,568	13,687,035
		84,868,664	**105,998,766**
මුළු වත්කම්		**1,513,160,488**	**1,512,810,873**
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		966,971,845	966,971,845
පොදු සංචිත		9,996,952	9,996,952
ප්‍රත්‍යාගණන සංචිත		561,202,984	536,119,419
රඳවාගත් ඉපැයුම්		(197,585,836)	(210,289,522)
විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත		(465,956,132)	(465,956,132)
මුළු හිමිකම		**874,629,812**	**836,842,562**
ජංගම නොවන වගකීම්			
පොලී ගෙවිය යුතු දිගුකාලීන වගකීම්	**10**	-	-
දිගුකාලීනව ගෙවිය යුතු දෑ	**12**	492,426,190	492,426,190
විශ්‍රාම පාරිතෝෂිත අරමුදල	**13**	3,795,861	3,297,663
		496,222,051	**495,723,853**
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	**14**	42,317,003	46,502,070
පොලී ගෙවිය යුතු කෙටිකාලීන වගකීම්	**10**	97,793,352	97,793,352
උපචිත බැංකු ණය පොලී	**11**	2,198,270	21,767,910
මුදල් හා මුදල් සමාන දෑ	**09**	-	14,181,126
		142,308,625	**180,244,458**
මුළු වගකීම්		**638,530,676**	**675,968,311**
මුළු හිමිකම් හා වගකීම්		**1,513,160,488**	**1,512,810,873**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 37 දක්වා සටහන් ඇතුලත් වේ.

අත්සන් කලේ,
එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක - ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
මූල්‍ය ප්‍රකාශන අනුමත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනුයේ,

අත්සන් කලේ,
එම්.අබ්දුල් රෂීක් - අධ්‍යක්ෂ

අත්සන් කලේ,
එස්.හුසේන් අහමඩ් බහිලා - සභාපති

2018 ජුනි මස 22 වන දින

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

විස්තීරණ ආදායම් හා රඳවා ගත් ඉපැයුම් ප්‍රකාශනය
2017 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2017	2016
		රු.	රු.
ආදායම්	**15**	15,130,564	63,620,375
විකුණුම් පිරිවැය	**උපලේඛන. I**	(16,215,007)	(66,524,748)
දළ අලාභය		**(1,084,443)**	**(2,904,373)**
වෙනත් ආදායම්	**16**	56,554,892	91,541,806
බෙදාහැරීම් වියදම්	**උපලේඛන.II**	(271,560)	(292,125)
පරිපාලන වියදම්	**උපලේඛන. III**	(20,523,572)	(40,571,362)
මූල්‍ය වියදම්	**17**	(16,500,602)	(15,703,919)
බදු පෙර ලාභය	**18**	**18,174,716**	**32,070,027**
බදු පිරිවැය		(2,876,611)	(369,184)
වර්ෂයට අදාළ ලාභය		**15,298,106**	**31,700,843**
වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්)	**19**	585,513	(995,620,044)
පෙර වර්ෂ සඳහා ගැලපීම්	**20**	(3,179,933)	-
මුළු විස්තීරණ ආදායම්/(වියදම්)		**12,703,686**	**(963,919,201)**
වර්ෂ ආරම්භයේ රඳවාගත් ඉපැයුම්		(676,245,654)	287,673,547
වර්ෂ අවසානය රඳවාගත් ඉපැයුම්		**(676,245,654)**	**(676,245,654)**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 37 දක්වා සටහන් ඇතුලත් වේ.

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2017 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2016.01.01 දිනට ශේෂය	**2016** වර්ෂයට අදාළ	පුනප්‍රකාශිත **2016. 12. 31** දිනට ශේෂය	**2017** වර්ෂයට	**2017. 12. 31** දිනට ශේෂය
ප්‍රකාශිත ප්‍රාග්ධනය	966,971,845	-	966,971,845	-	966,971,845
ප්‍රත්‍යාගණිත සංචිත	536,119,419	-	536,119,419	25,083,565	561,202,984
පොදු සංචිත	9,996,952	-	9,996,952	-	9,996,952
රඳවාගත් ඉපැයුම්	515,233,518	(725,523,040)	(210,289,522)	12,703,686	(197,585,836)
විකිණීම සඳහා වූ වත්කම්වලට අදාළ සංචිත	(227,559,971)	(238,396,161)	(465,956,132)	-	(465,956,132)
මුළු එකතුව	**1,800,761,763**	**(963,919,201)**	**836,842,562**	**37,787,250**	**874,629,812**

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 37 දක්වා සටහන් ඇතුලත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2017 රු.	2016 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
වර්ෂයට අදාළ බදු පෙර ලාභය		18,174,716	32,070,027
මුදල්මය නොවූ ආදායම්/(වියදම්) ගැලපීම :			
දේපල, පිරියත හා උපකරණවල ක්ෂය වෙන්කිරීම්	**03**	173,873	318,519
පාරිතෝෂිත වෙන්කිරීම්		331,100	3,408,375
සේවක ණයවලට අදාළ පොළී		(110,676)	-
තැම්පත්වලට අදාළ පොළී		(1,549,315)	-
භාණ්ඩාගාර බිල්පත්වලට පොළී		(501,660)	(1,718,277)
බැංකු ණය කපාහැරීම්		(16,144,188)	-
මුදල්යම නොවූ බැංකු ණය පොලී		16,500,602	-
මුදල්මය නොවූ නිවාස ණය පොලී		12,297	-
ආර්ථික සේවා ගාස්තු වියදම		-	1,065,027
තොග හානි		-	129,812
දේපල, පිරියත හා උපකරණ විකුණුම් ලාභය		(673,005)	(9,220,284)
		16,213,744	**26,053,199**
මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වූ වෙනස්කම්			
තොගයේ සිදු වූ අඩුවීම්/(වැඩිවීම්)	**07**	1,857,921	5,494,248
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දැඟි වූ අඩුවීම්/(වැඩිවීම්)	**08**	15,151,959	(8,711,440)
ගෙවිය යුතු බැංකු ණය පොළීහි වූ වැඩිවීම් /(අඩුවීම්)	**10**	(3,425,452)	10,540,978
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දැඟි වූ වැඩිවීම් /(අඩුවීම්)	**14**	(4,703,609)	(34,802,684)
		25,094,563	**(1,425,699)**
අඩුකිරීම් :			
පාරිතෝෂිත ගෙවීම්	**13**	(513,522)	(17,583,390)
පොළී ගෙවීම්		(18,922,737)	-
බදු ගෙවීම්		-	(163,388)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**5,658,304**	**(19,172,477)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
වත්කම් මිලදී ගැනීම්	**08**	(148,310)	(121,752)
වත්කම් විකිණීම්		3,094,010	8,008,050
තොග විකිණීම්			190,400
තැම්පතු මුදල් කර ගැනීම්		31,549,315	32,229,016
තැම්පතුවල ආයෝජනය කිරීම්		(30,501,660)	(1,718,277)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**3,993,355**	**38,587,437**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
ණය ගැනීම්		-	-
ණය හා අනෙකුත් ණය පහසුකම් පියවීම්		-	-
දිගුකාලීන ගෙවිය යුතු දැ පියවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**-**	**-**
වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දැඟි		9,651,659	19,414,960
මුදල් හා මුදල් සමාන දැඟි වර්ෂ ආරම්භක ශේෂය	**13 & 14**	(494,091)	(19,909,051)
මුදල් හා මුදල් සමාන දැඟි වර්ෂ අවසාන ශේෂය		**9,157,568**	**(494,091)**

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 30 සිට 33 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 34 සිට 37 දක්වා සටහන් ඇතුලත් වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මුල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
2017 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

1.සාමාන්‍ය තොරතුරු

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.
ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත. වර්තමානයේ මෙහි ප්‍රධාන කාර්‍යයන් ලෙස සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීම සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන නිපද වීම හා අලෙවිය සිදු කරනු ලබයි.

ලංකා සිමෙන්ති සමාගමේ ආසන්න හා අවසාන හිමිකාරීත්වය දරනුයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වේ.

<u>2.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය</u>

මෙම මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සදහන් වේ. මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කල බව සදහන් වේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂය පුරාම ඒකාකාරිව මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගෙන ඇත.

<u>2.1.මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ පදනම</u>

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගනිමින් මුල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මුල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශිත වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිත අතර එය ආසන්න රුපියලට වටයා ඇත.

<u>2.1.1.දිගුකාලීන පැවැත්ම</u>

ආයතනයේ අධ්‍යක්ෂවරුන් විසින් ආයතනයේ දිගුකාලීන පැවැත්ම පිළිබඳ අධ්‍යනයක් සිදු කර දිගුකාලීන පැවැත්මට ඇති හැකියාව පිළිබද සොයා බැලිය යුතු අතර ආයතනය ඇවර කිරීමක් හෝ අහෝසි කිරීමක් සිදු කිරීමට අදහස් නොකල යුතුවේ.

<u>2.2.ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්</u>

<u>2.2.1.පරිපාලිතයන්</u>

1981වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910/-ක් ආයෝජනය කල අතර එහි 62.45%ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට හිමිය. එහි සම මිල රු.10/-කි. මෙම ආයෝජනයට මේ වන තුරු ප්‍රතිලාභ ලැබී නොමැත.
මෙම ආයෝජනය පිරිවැයට පොත්වල සටහන් කර තිබූ අතර 2013 වර්ෂයේ සිට එය වෙළඳපොළ අගය පදනම් කර ගනිමින් ගිණුම්ගත කර ඇත. එහිදී හදුනාගනු ලබන අලාභ තත්වයන් අදාළ වර්ෂයේදී විස්තීරණ වියදම් යටතේ දක්වනු ලබන අතර ඒවායේ එකතුන් හිමිකම් යටතේ විකිණීම සඳහා වූ වත්කම්වලට අදාල සංචිත ලෙස දක්වනු ලැබේ.

<u>2.2.2.ආශ්‍රිතයන්</u>

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලෆාජ් සිමෙන්ති සමාගමේ රු.6,400,000/-ක් ආයෝජනය කර ඇත. එය පිරිවැයට පොත්වල සටහන් කර ඇත.මෙම ආයෝජනයන්ට අදාලව ලාභාංශ ලැබීමක් වේනම් එම ලැබීම වෙනත් ආදායම් ශීර්ෂය යටතේ දක්වනු ලැබේ.

2.3.අයභාරය හඳුනාගැනීම

සිමෙන්ති ආනයනය කර බෙදා හැරීම සහ කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම තුලින් ජනිත වන ආදායම් සහ ඊට අදාල වියදම් , එහි ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ සම්භාවිතාවය සැලකිල්ලට ගනිමින් විශ්වාසවන්ත පදනමක් මත කාලපරිච්ඡේදයට අදාල ප්‍රමාණය මිනුම් කර හඳුනාගනු ලැබේ.

අ. භාණ්ඩ විකිණීම

කාලපරිච්ඡේදයට අදාල භාණ්ඩ විකිණීම් ආදායම හඳුනාගනු ලබනුයේ විකුණූ භාණ්ඩවල අවධානම හා එවායේ අයිතිය ගැනුම්කරු වෙත පැවරීමෙන් පසුව වේ.

ආ. සේවා සැපයීම

සේවා සැපයීමට වෙනුවෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබනුයේ එම සේවයෙන් සම්පූර්ණ කරන ලද ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් හා ඊට අදාලව ගිවිසුමේ ඇස්තමේන්තුගත කල සම්පූර්ණ මිනිස් පැය ප්‍රමාණය, භාවිතා කරන ලද මිනිස් පැය ප්‍රමාණය සැලකිල්ලට ගනිමිනි.
ගිවිසුමට අදාල ආදායම් විශ්වාසනීයව මැනිය නොහැකි වූ විට ඊට දරණ ලද වියදම් පදනම් කරගනිමින් ආදායම් හඳුනා ගනු ලැබේ.

ඇ.පොලී

කාල අනුපාතය පදනම් කර ගනිමින් මෙම පොලී ආදායම් හඳුනාගනු ලබනුයේ වත්කම්වලට අදාල සඵල පොලී අනුපාතය සැලකිල්ලට ගනිමිනි.

ඇ.වෙනත්

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගනු ලැබේ.

2.4.රජයෙන් ලද ලැබීම්

ආදායම් ස්භාවයේ ප්‍රදානයන් හා සහනාධාර

ආයතනය විසින් දැරිය යුතු වූ යම් වියදමක් හෝ පාඩුවක් වෙනුවෙන් ලද නැවත ගෙවිය යුතු නොවන ප්‍රදානයක් හෝ සහනාධාරයක් ලැබීම එම වියදම හෝ පාඩුව හඳුනාගන්නා ලද කාලපරිච්ඡේදයට අදාල වන පරිදි ක්‍රමානුකූල පදනමක් යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

2.5.ණය පිරිවැය

යම් කාලපරිච්ඡේදයක් තුල දරණ ලද ණය සඳහා වූ පිරිවැය එම කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.6.ආදායම් බදු

කාලපරිච්ඡේදයට අදාල බදු පෙර ශුද්ධ ලාභයට/(අලාභයට) කරනු ලබන එකතු කිරීම් හා අඩුකිරීම් වලින් පසු අදාල වන බදු අනුපාතය ඊට ගැලපීමෙන් පසු ලැබෙනුයේ ආදායම් බදු පිරිවැය වේ.

කාලපරිච්ඡේදයට අදාල ආදායම් බදු පිරිවැයෙන්, කාලපරිච්ඡේදය තුල ගෙවන ලද ආදායම් බදු ගෙවීම් හා ආර්ථික සේවා ගාස්තු ලෙස හිලව් කර ගත හැකි ප්‍රමාණයන් ගැලපීම් කිරීමෙන් ලැබෙන අගය ගෙවිය යුතු ආදායම් බදු ලෙස හඳුනාගනු ලැබේ.

2.7.දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ වල වටිනාකම මනිනු ලබනුයේ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි අඩුකිරීමෙනි.

ක්ෂය වීම් ගණනය කිරීමේදී සෘජු ක්‍රමය භාවිතා කරන අතර එහිදී අදාල වත්කමේ පිරිවැයෙන් එහි අවශේෂ පිරිවැය අඩුකර එම වටිනාකම වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ඇස්තමේන්තු කිරීමෙනි.

ක්ෂය ගණනයේදී පහත දැක්වෙන වාර්ෂික ක්ෂය අනුපාත පදනම් කර ගනු ලැබේ.

විස්තරය	**ක්ෂය අනුපාතය**
ගොඩනැගිලි	6.67%
යන්ත්‍ර සූත්‍ර	12.5%
පස් ප්‍රවාහන යන්ත්‍ර හා බර යන්ත්‍රෝපකරණ	25.0%
මොටර් රථ වාහන	25.0%
මෙවලම් හා උපකරණ	25.0%
ලී බඩු හා සවිකිරීම්	25.0%
රේල් පීලි	10.0%

වත්කමට අදාල ක්ෂය අනුපාතයන්හි ඵලදායී ජීව කාලයෙහි හෝ අවශේෂ පිරිවැයෙහි සැලකිය යුතු වෙනසක් සිදු වේ නම් එම වත්කම ක්ෂය කිරීම අතීත කාලයට බලපාන පරිදි ගැලපීම් කරනු ලැබේ.
රු.10,000/-ට අඩු වටිනාකමක් සහිත දේපල පිරියත උපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හා එය මිලදී ගනු ලැබූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

<u>2.8.ආයෝජන දේපල</u>

<u>අ.පුත්තලම, අරුවක්කාලුහි පිහිටි ඉඩම</u>

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් අක්කර 5,352කින් යුතු ඉඩම 1993වසරේදී 50ක කාලයකට හොලිසීම් ලංකා සමාගමට බදු ගිවිසුමක් යටතේ බදු දී ඇත. මෙම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එය ලද විගස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

<u>ආ.කොල්ලුපිටියේ හා පුත්තලමේ පිහිටා ඇති ඉඩම්</u>

යම් දේපලක් තුලින් කුලී ආදායමක් ඉපයනු ලබන්නේ නම් හෝ එහි ප්‍රාග්ධනිත අගයෙහි වටිනාකම වැඩිවේ නම් හෝ එම කරුණු දෙකම වේ නම් එය ආයෝජන දේපලක් වේ. නමුත් එම දේපල සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු ලෙස විකුණනු ලබන්නක් , නිෂ්පාදන සැපයුමක්, සේවා සැපයුමක් හෝ පරිපාලන කටයුතු සඳහා යොදා නොගන්නා දේපලක් වේ. ආයෝජන දේපලවල වටිනාකම සාධාරණ අගය මත පදනම්ව හෝ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සියලු සමුච්චිත හානි අඩුකිරීමෙන් ලැබෙන අගය මත පදනම්ව අගය කල හැක.

<u>ඇ.දුම්රිය මෙහෙයුම් මැදිරි</u>

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ මෙහෙයුම් කටයුතු සඳහා මෙම දුම්රිය මෙහෙයුම් මැදිරි භාවිතා කර ඇත. ඒවා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව සාධාරණ අගය පදනම් කර ගනිමින් ආයෝජන දේපල ලෙස හඳුනාගෙන තිබෙන අතර එය පොත් වල සටහන් කර ඇත.
මෙම දේපලට අදාලව ඉදිරියට ගෙන යනු ලබන අගයෙහි වැඩිවීමක් තිබේනම් පෙරදී හඳුනාගනු ලැබූ හානි සඳහා පියවීම් කර ඉතිරියක් වේනම් එය ප්‍රත්‍යාගණිත සංචිතයට හඳුනාගනු ලැබේ. එම වටිනාකමෙහි අඩුවීමක් වේනම් එය වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්) යටතේ හඳුනාගත යුතුවේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
2017 දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

2.9.කල්බදු

කල්බදු වර්ගීකරණයේදී මූල්‍ය කල්බදු ලෙස හඳුනාගනු ලබනුයේ කල්බද්ධට අදාල වත්කමේ අයිතියෙහි අවධානම හා විපාකය කල්බදු දෙනු ලබන අවස්ථාවේදීම ආයතනයට මාරු වන්නේ නම් පමණි. අනෙකුත් කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය කල්බදු වත්තම්හි සාධාරණ අගය (කල්බදු වාරිකයන්හි වර්තමාන වටිනාකම යන දෙකෙන් අඩු අගය) පදනම් කර ගනිමින් ආයතනය සතු වත්කමේ වටිනාකම සදුනාගනු ලැබේ. කල්බදු හිමියා විසින් මෙහි වන වගකීම ඔහුගේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ. කල්බදු වාරිකය තුල කල්බදු සඳහා වන පොලීය හා කල්බදු වගනීමෙන් අඩු වන ප්‍රමාණයද අඩංගු වේ. කල්බදු සඳහා වන පොලිය වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ. මූල්‍ය කල්බදු යටතේ අත්පත් කරගනු ලැබූ වත්කම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ නිරූපණය කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු යටතේ ගෙවනු ලබන වාරික ගෙවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.10.තොගය

තොගයෙහි වටිනාකම ලෙස ගිණුම්ගත කරනුයේ එහි පිරිවැය හෝ විකුණුම් අගයෙන් විකුණුම් හා සම්බන්ධ පිරිවැයන් අඩුකල පසු ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය වේ.

එනම් තොග සහ කෙරෙමින් පවතින වැඩ, ගත්මිල අනුව හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කිරීමෙනි.

පිරිවැය ගණනයේදී ප්‍රථමයෙන් ලද තොග ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය සැලකිල්ලට ගනු ලැබේ.

2.11.වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

බොල් ණය සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන ඉන්වොයිස් වටිනාකමින් අඩුකොට ලැබෙන වටිනාකම වෙළඳ ණයගැතියන් ලෙස දක්නු ලැබේ.

2.12. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

ණය පදනම යටතේ මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් ඇති වන මෙම වගකීම් පොලී අය කිරීමකින් තොර වේ.

විදේශීය ගනුදෙනු සම්බන්ධයෙන් ඇති වන වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්ථනය කර ගිණුම්ගත කරන ඇතර ඉන් ඇති වන විදේශීය මුදල් හුවමාරු ලාභ / (අලාභ) වේ නම් එය වෙනත් ආදායම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.13.බැංකු ණය හා අයිරා පහසුකම්

බැංකු ණය හා අයිරා පහසුකම් සඳහා වන පොලී ගණනයේදී සඵල පොලී අනුපාතයන් පදනම් කර ගනු ලබන අතර එය මූල්‍ය වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

2.14.වෙන්කිරීම්, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය තත්ව ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන දිනට යම් කරුණක් සම්බන්ධව වගකීමක් ඇතිවේනම් හෝ ඊට අදාළව සම්පත් ගලායාමට සම්භාවිතාවයක් තිබේනම් හා එම සම්පත් ගලායෑම ඇස්තමේන්තු කල හැකි නම් ඊට අදාළව වෙන්කිරීම් සිදු කල යුතු වේ.

ආයතනයේ සම්පත් ගලායෑමේ ප්‍රවණතාවයක් නොමැති වුවද සියලුම අසම්භාව්‍ය වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ.

ආයතනය තුලට සම්පත් ගලාඒමේ ප්‍රවණතාවයක් වේනම් පමණක් අසම්භාව්‍ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් වෙළඳ ලැබිය යුතු වටිනාකම් වෙනුවෙන් අධිකරණයේ නඩු දහතුනක් (13) ගොනු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
2017 දෙසැම්බර් මස 31 දිනට

03. දේපල, පිරියත හා උපකරණ

පිරිවැය	2017.01.01 දිනට ශේෂය	පෙර වර්ෂ සඳහා ගැලපීම්	වර්ෂය තුල වූ එකතුකිරීම්	වර්ෂය තුල වූ අඩුකිරීම්	2017.12.31 දිනට ශේෂය
ඉඩම් හා ගොඩනැගිලි	1,595,981	-	-	-	1,595,981
මෝටර් රථ	4,562,891	-	-	-	4,562,891
ලී බඩු හා සවිකිරීම්	5,604,098	20,300	256,060	1,304,883	4,575,575
මේවලම් හා උපකරණ	1,224,653	(20,300)	7,750	923,473	288,630
	12,987,623	**-**	**263,810**	**2,228,356**	**11,023,077**

සමුච්චිත ක්ෂය වෙන්කිරීම්	2017.01.01 දිනට ශේෂය	පෙර වර්ෂ සඳහා ගැලපීම්	වර්ෂයට අදාළ ක්ෂය කිරීම්	වර්ෂයට අදාළ ඉවත්කිරීම්	2017.12.31 දිනට ශේෂය
ඉඩම් හා ගොඩනැගිලි	333,811	62,170	-	-	395,981
මෝටර් රථ	2,187,280	2,331,051	44,560	-	4,562,891
ලී බඩු හා සවිකිරීම්	5,391,687	-	103,743	1,306,497	4,188,933
මේවලම් හා උපකරණ	1,187,876	(11,163)	25,570	916,523	285,760
	9,100,654	**2,382,058**	**173,873**	**2,223,020**	**9,433,565**
ශුද්ධ පොත් අගය	**3,886,969**				**1,589,512**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු නො.287, ගාලු පාර, කොළඹ 02 ලිපිනයෙහි පිහිටි ඉඩමේ වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය තුල ඇතුලත් වේ. මෙම ඉඩම උගස් බැදුම්කර අංක 2426 යටතේ රු.172,000,000/-ක් දක්වා ණය පහසුකම් ලබා ගැනීමට උගස් කර ඇත.

එසේම මෙම ඉඩම 2013 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර ඇත.

එසේම පුත්තලම පාලාවිහි පිහිටි අක්කර 221කින් යුතු ඉඩමේ අක්කර 152ක් සඳහා 2013 වර්ෂයේදී තක්සේරු කල අතර එම ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කර ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි අක්කර 751කින් යුතු ඉඩමේ වටිනාකම ගිණුම්ගත කර නොමැත.

ඉන් අක්කර 231ක් පිඹුරුපත් අංක ඒ 2099 යටත් රජයෙන් ලද ඉඩමක් වන අතර ඉතිරි ප්‍රමාණය වන අක්කර 520 පිඹුරුපත් අංක ඒ1557, ඒ1484, ඒ1562 හා ඒ2438 හි ඇතුලත් වන අතර 1964 අංක 14,012දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැසට් පත්‍ර යේ වගන්ති අංක 460 යටතේ වන්දි ගෙවා අත්ලත් කරගෙන ඇත.

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පිහිටා ඇති අක්කර 6කින් යුත් සංස්ථාව සතු ඉඩමේ වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය තුල ඇතුලත් වේ. සංස්ථාවේ අනුමැතියකින් තොරව සුනාමි නිවාස , ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මුල් වී ඉදිකර ඇති බැවින් මීට සුදුසු වන්දි මුදලක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

04. ආයෝජන දේපල	**2017 රු.**	**2016 රු.**
ඉඩම - කොළඹ 02	735,000,000	712,500,000
ඉඩම - පාලාවි	61,200,000	61,200,000
දුම්රිය මෙහෙයුම් මැදිරි	750,000	-
	796,950,000	**773,700,000**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් මෙම ඉඩම්වල වටිනාකම් ආයෝජන වත්කම් ලෙස සාධාරණ අගය මත ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්ති අංක 40 (ආයෝජන වත්කම්) හිප්‍රතිපාදන අනුව හඳුනාගෙන ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013 ඔක්තෝම්බර් මස02 වන දින නිකුත් කරන ලද තක්සේරු වාර්තාව පදනම් කරගනිමින් මෙම වටිනාකම් ගිණුම්ගත කර ඇත.

05. දිගුකාලීනව ලැබියු යුතු දෑ

ලංකා සිමෙන්ති සමාගම ස්ථාපිත කිරීමට අදාළ දිගු කාලීන හා කෙටි කාලීනව ලැබිය යුතු වූ දෑ	360,311,323	424,169,977
ලංකා සිමෙන්ති සමාගම හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව අතර සිදු වූ අභ්‍යන්තර ගනුදෙනු සඳහා ලැබිය යුතු වූ දෑ	396,912,560	333,053,906
ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ වෙනුවෙන් කරන ලද වෙන්කිරීම්	(757,223,883)	(757,223,883)
	-	-

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්

2017 දෙසැම්බර් මස 31 දිනට

		2017 SLCC Rs.	2016 SLCC Rs.
06.	**ආයෝජනයන්**		
	භාණ්ඩාගාර බිල්පත්	5,689,533	5,162,359
	පරිපාලිතයන් සහ ආශ්‍රිතයන්ගේ ආයෝජනයන්		
	පරිපාලිත - ලංකා සිමෙන්ති සමාගම	617,662,779	617,662,779
	ලෆාජ් සිමෙන්ති (පෞද්.) සමාගම	6,400,000	6,400,000
		629,752,312	**629,225,138**
07.	**තොගය**		
	කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ අමුද්‍රව්‍ය හා නොනිමි වැඩ	238,256	238,256
	කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ නිමි තොගය	1,003,501	2,861,422
	සිමෙන්ති තොගය	-	-
		1,241,757	**3,099,678**
08.	**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**		
	වෙළඳ ණයගැතියෝ	40,506,986	53,269,065
	අඩමාණ ණය වෙන් කිරීම්	(977,166)	(977,166)
	ලැබිය යුතු කුලී	2,517,154	2,410,636
	ලැබිය යුතු අගරු වූ චෙක්පත්	11,445,377	11,445,377
	දේශීය ඇණවුම් මත කලින් ලැබීම්	1,131,622	1,131,622
	ලැබිය යුතු තැම්පත්	1,708,125	1,824,626
	සිමෙන්ති මත ලැබිය යුතු තැම්පත්	976,971	976,971
	උත්සව අත්තිකාරම්	-	3,375
	සේවක ණය	2,061,696	1,078,545
	කලින් ගෙවූ වියදම්	313,378	249,008
	ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ	253,580	253,579
	වැටුප් අත්තිකාරම්	-	10,000
	විවිධ අත්තිකාරම්	240,947	245,947
	භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ	48,000	48,000
	ලැබිය යුතු එකතු කල අගය මත බදු	10,694,743	10,963,244
	ලැබිය යුතු ආර්ථික සේවා ගැස්තු	126,758	1,421,056
	ලැබිය යුතු රදවාගත් බදු	2,748,462	2,748,462
	වෙනත් ලැබිය යුතු දෑ	-	1,437,000
	එන්.එච්.ඩී.ඒ. ආයතනයෙන් ලැබිය යුතු දෑ	672,706	672,706
		74,469,339	**89,212,053**
09.	**මුදල් හා මුදල් සමාන දෑ**		
	බැංකුවේ තිබෙන මුදල්		
	- ලංකා බැංකුව, ලේක් වීව් ශාඛාව	2,156,449	2,654,122
	- ලංකා බැංකුව, ආයතනික ශාඛාව	874,820	-
	- මහජන බැංකුව, විදේශ අංශය	252,754	253,954
	- මහජන බැංකුව, ලිබර්ටි ප්ලාසා ශාඛාව	5,501,747	5,982,807
	- මහජන බැංකුව, වවුනියාව ශාඛාව	-	22,046
	- මහජන බැංකුව, කන්කානෙට්ටි ශාඛාව	371,798	4,774,106
		9,157,568	**13,687,035**
10.	**පොළී ගෙවිය යුතු වගකීම්**		
	බැංකු අයිරාව		
	ලංකා බැංකුව, ආයතනික ශාඛාව	-	14,181,126
		-	14,181,126
	බැංකු ණය		
	ලංකා බැංකුව, ණය අංකය - 74129310	24,000,000	24,000,000
	ලංකා බැංකුව, සිමෙන්ති ආනයනය කිරීමට අදාළ ණය	56,293,352	56,293,352
	ලංකා බැංකුව, ණය අංකය - කෙටිකාලීන ණය	17,500,000	17,500,000
		97,793,352	97,793,352
		97,793,352	**111,974,478**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්
2017 දෙසැම්බර් මස 31 දිනට

		2017	2016
		රු.	රු.
11.	**ගෙවිය යුතු ණය පොළී**		
	ගෙවිය යුතු බැංකු අයිරා පොළී	1,453,715	21,767,910
	ගෙවිය යුතු බැංකු ණය පොළී	744,555	-
		2,198,270	21,767,910
12.	**දිගුකාලීන වගකීම්**		
	භාණ්ඩාගාර අත්තිකාරම්	492,426,190	492,426,190
		492,426,190	**492,426,190**
13.	**විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම්**		
	2017.01.01 දිනට ශේෂය	3,297,663	18,696,935
	වර්ෂය තුල මුදලින් කල ගෙවීම්	(603,540)	(18,807,647)
		2,694,123	(110,712)
	වර්ෂයට අදාළ වෙන්තිරීම්	331,100	3,408,375
	2017.12.31 දිනට ශේෂය	**3,795,861**	**3,297,663**
14.	**වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**		
	වෙළඳ ණයහිමියෝ	3,090,311	3,090,310
	ගෙවිය යුතු අගරු වූ චෙක්පත්	554,533	757,882
	සිමෙන්ති අත්තිකාරම්	1,079,410	1,079,410
	උපචිත වියදම්	4,092,771	4,236,049
	බී.සී.සී. ආයතනයට ගෙවිය යුතු කුලී	766,150	766,150
	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු කුලී	8,322,724	8,322,724
	ගෙවිය යුතු තැම්පතු	1,285,626	1,952,073
	ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	126,756	1,447,609
	ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු	8,410,618	11,340,955
	වැටුප් පාලන ගිණුම	177,656	141,213
	නොගෙවූ වැටුප්	53,070	51,645
	රඳවාගත් කාසි	468	64
	ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්	97,515	87,353
	ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල්	13,404	11,981
	ගෙවිය යුතු අධ්‍යක්ෂ පාරිතෝෂිත	8,182	-
	ගෙවිය යුතු ආදායම් බදු	1,355,144	-
	ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු	27,782	26,767
	ගෙවිය යුතු එකතු කල අගය මත බදු	12,854,883	13,189,885
		42,317,003	**46,502,070**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්

2017 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2017	2016
		රු.	රු.
15.	**ආදායම්**		
	සිමෙන්ති විකුණුම්	14,144,593	60,150,810
	කොන්ක්‍රීට් කණු විකුණුම්	1,150,847	4,069,925
	(-) ජාතිය ගොඩනැගීමේ බදු	(164,876)	(600,360)
		15,130,564	**63,620,375**
16.	**වෙනත් ආදායම්**		
	හුණුගල් නිධිය සහිත ඉඩමට අදාල කල්බදු	30,377,665	26,851,358
	සේවක ණය මත ලද පොලී	110,676	312,031
	තැම්පතු මත ලද පොලී	1,549,315	-
	භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී	501,660	1,718,277
	ස්ථාවර වත්කම් විකිණීමට අදාල ලාභ	673,005	9,356,004
	විවිධ ආදායම්	177,765	637,592
	භාණ්ඩාගාර ලැබීම්	-	48,883,044
	කුලී ආදායම්	7,020,618	3,783,500
	බැංකු ණය කපාහැරීම්	16,144,188	-
		56,554,892	**91,541,806**
17.	**මූල්‍ය වියදම්**		
	බැංකු අයිරා පොලී	2,267,504	3,270,937
	බැංකු ණය පොලී	14,233,098	12,432,982
		16,500,602	**15,703,919**
18.	**බදු පෙර ලාභය**		
	බදු පෙර ලාභය ගණනයේදී පහත සඳහන් වියදම් අඩුකර ඇත:		
	සේවක පිරිවැය	7,555,455	14,429,524
	අධ්‍යක්ෂ පාරිතෝෂිත	3,368,225	2,973,004
	ක්ෂය වෙන්කිරීම්	173,873	318,519
	විගණන ගාස්තු	150,000	150,000
	තොග හානි	-	129,812
	පාරිතෝෂිත වෙන්කිරීම්	331,100	3,408,375
19.	**අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්)**		
	මූල්‍ය වත්කම් මත ලාභ/(අලාභ)	-	(238,396,161)
	ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ සඳහා අඩමාණ ණය වෙන්කිරීම්	-	(757,223,883)
	ලොගොමෝටිව් දුම්රිය මැදිරි විකිණීම මත වූ ලාභ/(අලාභ)	585,513	-
		585,513	**(995,620,044)**
20.	**රදවාගත් ඉපැයුම් සඳහා කරන ලද පෙර වර්ෂ ගැලපීම්**	**රු.**	
	2016/12/31 දිනට රදාගත් ඉපැයුම්		(676,245,654)
	වෙළඳ ගෙවිය යුතු දෑ	(518,542)	
	සමුච්චිත ක්ෂය වෙන්කිරිම්	(2,391,608)	
	ස්ථාවර වත්කම්	9,344	
	බැංකුවේ තිබෙන මුදල්	56,754	
	භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන	25,514	
	පාරිතෝෂිත වෙන්කිරීම්	(770,640)	
	වෙළඳ ලැබිය යුතු දෑ	409,245	**(3,179,933)**
			(679,425,587)

21. prf Consolidated Financial Statements - 2017

2018 ජුනි මස 22 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කල අතර නිකුත් කිරීමට අනුමැතිය ලබාදෙන ලදි.

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2017 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2017	2016
	යොමුව	රු.	රු.
ආදායම		15,130,564	63,620,375
විකුණුම් පිරිවැය	අ	(16,215,007)	(66,524,748)
දළ අලාභය		**(1,084,443)**	**(2,904,373)**
වෙනත් ආදායම්	ආ	56,554,892	91,541,806
බෙදාහැරීම් වියදම්	ඇ	(271,560)	(292,125)
පරිපාලන වියදම්	ඇ	(20,523,572)	(40,571,362)
මූල්‍ය වියදම්වලට පෙර ලාභය		**34,675,318**	**47,773,946**

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන

2017 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2017	2016
අ. විකුණුම් පිරිවැය		
	රු.	රු.
සිමෙන්ති අලෙවිය		
ආරම්භක තොගය	-	3,075,850
මිලදී ගැනුම් හා සෘජු පිරිවැය	14,325,075	52,279,832
අඩුකිරීම් : අවසාන තොගය	-	-
	14,325,075	55,355,682
කොන්ක්‍රීට් කණු අලෙවිය		
ආරම්භක තොගය	3,097,767	6,104,684
මිලදී ගැනුම්	-	7,556,080
සෘජු පිරිවැය	32,011	369,724
අඩුකිරීම් : අවසාන තොගය	(1,239,846)	(2,861,422)
	1,889,932	11,169,066
	16,215,007	**66,524,748**
ආ. වෙනත් ආදායම්		
හුණුගල් නිධිය සහිත ඉඩමට අදාල කල්බදු	30,377,665	26,851,358
සේවක ණය මත ලද පොලී	110,676	312,031
තැම්පතු මත ලද පොලී	1,549,315	-
භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී	501,660	1,718,277
ස්ථාවර වත්කම් විකිණීමට අදාල ලාභ	673,005	9,356,004
විවිධ ආදායම්	177,765	637,592
භාණ්ඩාගාර ලැබීම්	-	48,883,044
කුලී ආදායම්	7,020,618	3,783,500
බැංකු ණය කපාහැරීම්	16,144,188	-
	56,554,892	**91,541,806**
ඇ. බෙදාහැරීම් වියදම්		
මෝටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම්	44,560	180,288
දැන්වීම් හා ප්‍රදර්ශන වියදම්	227,000	111,837
	271,560	**292,125**
ඈ. පරිපාලන වියදම්		
වැටුප් හා වේතන	6,230,565	12,378,966
අතිකාල ගෙවීම්	193,208	452,629
සේවක අර්ථසාධක අරමුදල් වියදම්	623,168	988,469
සේවක භාරකාර අරමුදල් වියදම්	155,792	248,436
වෛද්‍ය නිවාඩු සඳහා කල ගෙවීම්	352,722	361,024
අධ්‍යක්ෂ පාරිතෝෂික වියදම්	3,368,225	2,973,004
විගණන කමිටු රැස්වීම් වියදම්	128,000	75,000
ලබා නොගත් වෛද්‍ය නිවාඩු වියදම්	-	8,677
වාර්ෂික ප්‍රසාද මුදල්	211,950	209,250
වෛද්‍ය පහසුකම්	43,412	124,353
තේ සඳහා වූ දීමනාව	67,400	231,981
	11,374,442	**18,051,789**

විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය සඳහා උපලේඛන

2017 දෙසැම්බර් සම 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2017**	**2016**
	රු.	රු.
පෙර පිටුව ……………	**11,374,442**	**18,051,789**
ආහාර දීමනාව	354,840	649,410
සුභසාධන වියදම්	339,741	183,089
නිවාස ණය මත පොලී ප්‍රතිපූර්ණය කිරීම	12,297	15,180
ගොඩනැගිලි ක්ෂය	-	26,412
ලීබඩු හා සවිකිරීම් ක්ෂය	103,743	72,331
මෙවලම් හා උපකරණ ක්ෂය	25,570	39,488
කුලී	1,009,366	1,006,875
විදුලි බිල්පත් වියදම්	275,152	343,982
තැපැල් හා දුරකථන වියදම්	349,807	484,472
මුද්‍රණ හා ලිපිලේඛන වියදම්	230,061	347,211
වරිපනම් ගාස්තු	9,533	-
පොදු වියදම්	319,311	295,893
ආර්තික සේවා ගාස්තු වියදම්	-	1,065,027
ගමන් ගාස්තු වියදම්	156,052	204,880
ඉඩම් නිරීක්ෂන හා අනෙකුත් වියදම්	1,559,880	-
මෝටර් රථ වියදම්	327,219	441,181
ලේකම් කටයුතු සඳහා වූ වියදම්	87,068	26,870
කාර්යාල උපකරණ අළුත්වැඩියා වියදම්	80,748	246,408
ප්‍රකාශන වියදම්	31,590	47,510
විගණන ගාස්තු	150,000	150,000
තක්සේරු ගාස්තු	1,736,300	52,655
පාරිතෝෂිත වෙන් කිරීම්	331,100	3,408,375
ජල වියදම්	88,422	41,520
තොග හානී	-	129,812
බැංකු ගාස්තු	53,857	95,877
ආරක්ෂක වියදම්	512,151	244,166
අළුත්වාඩියා වියදම්	38,765	-
නීති හා වෘත්තිය ගාස්තු	28,000	-
තාවකාලික සේවකයින් සඳහා වූ වියදම්	938,557	-
සේවක වන්දි (ස්.ව.යෝ.ක්‍රමය)	-	12,900,949
	20,523,572	**40,571,362**

ආදායම් බදු ගණනය

2017 තක්සේරු වර්ෂය සඳහා

	යොමුව		+රු.	-රු.
2017 වර්ෂය සඳහා ලාභය	**P & L**		18,174,716	
තැම්පතු මත ලද පොලී	**P & L**			1,549,315
භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී	**P & L**			501,660
වෙනත් ආදායම්	**P & L**			
බැංකු ණය කපාහැරීම්	**P & L**		585,513	
ප්‍රාග්ධන දීමනා	**Sch. I**			278,597
ක්ෂය	**P & L**		173,873	
වත්කම් ඉවත් කිරීම් ලාභ	**P & L**			673,005
වත්කම් ඉවත් කිරීම් ලාභ	**Sch. II**		673,005	
පාරිතෝෂිත වෙන් කිරීම්	**P & L**		331,100	
පාරිතෝෂිත ගෙවීම්	**P & L**			603,540
දැන්වීම් වියදම්	**P & L**		56,750	
			19,994,958	**3,606,118**
ගැලපීම් කරන ලද ලාභය				**16,388,840**
වෙනත් ආදායම්				2,050,975
මුළු ව්‍යවස්ථාපිත ආදායම්				**18,439,815**
තක්සේරු කල හැකි ආදායම				**18,439,815**
අඩුකලා :				
2016 සිට ඉදිරියට ගෙන එනු ලබන අලාභය		103,486,892		
2017 වර්ෂයේ අලාභය		-		
ව්‍යවස්ථාපිත ආදායමෙන් 35%		(6,453,935)		**(6,453,935)**
2018 වර්ෂයට ගෙන යනු ලබන අලාභය		**97,032,957**		
බදු වන ලාභය				**11,985,880**
මුළු ආදායම් බදු වියදම		11,985,880	24%	2,876,611
ගෙවූ ආර්ථික සේවා ගාස්තු				
2013	166,438			
2014	-			
2015	-			
2016	163,388			
2017	1,191,641			
	1,521,467			
ආර්ථික සේවා ගාස්තු අඩුකිරීම්	(1,521,467)			(1,521,467)
ආර්ථික සේවා ගාස්තු වියදම්	-			
	-			
ගෙවිය යුතු ආදායම් බද්ද				**1,355,144**

ආදායම් බදු ගණනය

2017 තක්සේරු වර්ෂය සඳහා

උපලේඛනය I - ප්‍රාග්ධන දීමනාව

2017 වර්ෂය සඳහා	**අනුපාතය %**	**පිරිවැය**	**2017 දීමනාව**
ලීබඩු හා සවිකිරීම්	20%	140,561	9,375
මෙවලම් හා උපකරණ	12.5%	7,750	517
			9,892
2012 ට පෙර වර්ෂ සඳහා			
ගොඩනැගිලි	6.67%	395,981	26,412
මොටර් රථ .	20%	6,650,714	-
ලීබඩු හා සවිකිරීම්	20%	546,564	-
මෙවලම් හා උපකරණ	12.5%	47,330	5,916
			32,328
2016 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	91,497	18,299
මෙවලම් හා උපකරණ	12.5%	30,255	3,782
			22,081
2015 වර්ෂය සඳහා			
මෙවලම් හා උපකරණ	12.5%	18,180	2,273
			2,273
2014 වර්ෂය සඳහා			
ලීබඩු හා සවිකිරීම්	20%	135,727	27,145
මෙවලම් හා උපකරණ	12.5%	26,245	3,281
			30,426
2013 වර්ෂය සඳහා			
මොටර් රථ	20%	721,150	144,230
ලීබඩු හා සවිකිරීම්	20%	153,648	30,730
මෙවලම් හා උපකරණ	12.5%	53,100	6,638
			181,597
2017 වර්ෂයට අදාළ ප්‍රාග්ධන දීමනාව			**278,597**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම.

2. මූල්‍ය ප්‍රකාශන

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් වාර්ෂිකව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාවේ පරිපාලිත සමාගම වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ 2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකල බැවින් මෙම වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ නොහැකි විය.

මෙම පරිපාලිතය වන සී/ස ලංකා සිමෙන්ති සමාගම විසින් 2018 වර්ෂයේ ජූලි මස අවසාන වන විටත් 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සංස්ථාව වෙත ඉදිරිපත් නොකරන ලදි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) පිළිගනිමු. මේ වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි ඉඩම් මැනුම් කටයුතු සිදු කර අවසන් කර ඇත. මෙම ඉඩමේ තක්සේරු වටිනාකම ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරන අතර එය ලබාගත් විගස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පිළිගනිමු. මෙම ඉඩමේ ඉතිරි අක්කර 69ට අදාල තක්සේරු වටිනාකම ලබාගත් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පිළිගනිමු. මෙම ඉඩම සඳහා 2016දී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අප කරන ලද ඉල්ලීමකට අනුව තක්සේරු කර ඇති අතර ඊට අදාල තක්සේරු ගාස්තුව රු.22,985,800/-ක් වන බව දන්වා ඇත. එම මුදල ගෙවීමට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් මේ වන විට සංස්ථාව සතු නොවන බැවින් එම දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කර එහි වටිනාකම ලබාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කරනු ලැබේ.

(ඈ) 2016/2017 වර්ෂයට අදාළ සංශෝධිත ආර්ථික සේවා ගාස්තු වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ගිණුම් වාර්තා වල මෙම 1990ට අදාළ ගෙවිය යුතු විගණන ගාස්තු වෙන්කිරීමක් ඉදිරියට ගෙන ඒම සිදු කර නොමැත. එසේම එම වර්ෂයට පසු වර්ෂ වලට අදාල විගණන ගාස්තු ගෙවීම් සිදු කර ඇති බැවින් මෙය ගිණුම්ගත කිරීමට එය තහවුරු කරගත යුතු වේ.

එසේම, 2015 වර්ෂයට අදාළව ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.150,000/-ක් වෙන් කර ඇත.

2016 වර්ෂයට අදාළව යොජිත විගණන ගාස්තුවට එකග නොවන බව හා ඊට හේතු ඉදිරිපත් කරමින් ලිපියක් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඊට පිළිතුරු ලැබී නොමැත. එබැවින් 2017 වර්ෂයට අදාළව විගණන ගාස්තු ලෙස රු.150,000/-ක් වෙන් කර ඇත.

පෙර පිටුව ....

<u>ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම.</u>

<u>2.2. 3 විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

(අ) 2008 වර්ෂයේදී සිදු කරන ලද සිමෙන්ති ආනයනය කිරීමට අදාළ ලිපි ලේඛන විමර්ෂණ කටයුතු සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් රැගෙන ගොස් තිබිණි. එම ලිපිගොනු හා ඊට අදාළව සංස්ථාවේ තිබූ ලිපිගොනු විගණනය සඳහා 2018.01.12 වන දින ඉදිරිපත් කරන ලදි.

(ආ) 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුලත් මෙම භාණ්ඩ පිළිබඳ නැවත සොයා බලා ඒවායේ වටිනාකම් සමග සවිස්තරාත්මක වාර්තාවක් සකස් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් ලබාදී ඇත.

<u>2. 3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) ආයතනයේ මූල්‍ය තත්වය යහපත් වූ පසු මෙම ගෙවිය යුතු ශේෂ ගෙවා පියවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙම ලැබිය යුතු ශේෂ සම්බන්ධව විශේෂ කමිටුවක් පත් කර ඊට අදාල කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) ජාතිය ගොඩනැගීමේ බදු මුදල් වාරික වශයෙන් ගෙවීම් මේ වන විට සිදු කරමින් පවතින බැවින් එය අවසන් වූ පසු මෙම ගෙවිය යුතු එකතු කල අගය මත බදු ශේෂය ගෙවා පියවීම සම්බන්ධව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සාකච්ජා කරනු ලැබේ.

<u>2.4නීති රීති හා රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ජා කර මාසිකව රු.1,000,000/-ක් ලෙස මෙම ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ගෙවීමට එකග වූ අතර 2017 ඔක්තෝම්බර් මස සිට ගෙවීම් ආරම්භ කරන ලදි.

2018 ජූලි මස ගෙවිය යුතු වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් වාරික වශයෙන් ගෙවා අවසන් කර ඇත.

(ආ) පිළිගනිමු.

(ඇ) (I) 2018 වර්ෂයට අදාළ සැලසුම් සකස් කිරීමේදී , පෙර වර්ෂ වලදී සාක්ෂාත් කරගත නොහැකි වූ අරමුණු හා ඊට හේතු වූ කරුණු පිළිබඳව හා සංස්ථාවට පවරා තිබෙන වර්තමාන අරමුණු පිළිබඳ අවධානය යොමුකර ඇත.

(II) මෙම කරුණු 2018 සිට 2020 දක්වා වූ සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී ඇතුලත් කර ඇත.

(ඈ) පිළිගනිමු. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය මත මෙම සේවක මුදාහැරීම සිදු කර ඇත. ඉදිරියට මෙවැනි මුදාහැරීම් සිදු නොකිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) මෙම විවිධ අත්තිකාරම් ගිණුමේ වර්ෂ අවසාන දිනට ලැබිය යුතු ලෙස දක්වා තිබෙන ශේෂයෙන් රු.185,934/-කට අදාළ අත්තිකාරම් නිකුත් කිරීම් හදුනාගෙන ඇති අතර ඒවා පිළිබඳ සොයා බලා පියවීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉතිරි රු.55,012/-ක ශේෂය 2010 වර්ෂයට පෙර සිට පැවතෙන නිරවුල් නොකල ශේෂයකි. මේ පිළිබඳ සොයා බලා නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

පෙර පිටුව ....

<u>ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම.</u>

<u>3. මූල්‍ය සමාලෝචය</u>

<u>3.1 මූල්‍ය ප්‍රතිඵල</u>

පිළිගනිමු.

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය තුල එම වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ස්වේච්ඡා වන්දි යොජනා ක්‍රමය යටතේ සේවකයින් විශ්‍රාම ගැන්වීමට අදාළව මහාභාණ්ඩාගාරයෙන් ලද වන්දි සහ පාරිතෝෂිත මුදල් වලින් වූ බලපෑමද ඇත. නමුත් 2017 වර්ෂයේදී සිමෙන්ති විකුණුම් නැවතීමෙන් පසුද මූල්‍ය ප්‍රතිඵලය ලෙස අතිරික්තයක් උපයා ඇත.

පිළිගනිමු.

<u>4 මෙහෙයුම් සමාලෝචනය</u>

<u>4.1.1 සැලසුම් කිරීම</u>

(අ) පිළිගනිමු.

(ආ) 2017 සිට 2019 වර්ෂයන්ට අදාළ සංයුක්ත සැලැස්ම, 2016 වර්ෂයේ ක්‍රියාකාරීත්වය හා ඉදිරි වර්ෂ වලදී සිදු විය හැකි දෑ පදනම් කර ගනිමින් සකස් කරනු ලබනු ලැබේ. නමුත් මෙම වර්ෂයේ සිදු වූ බලාපොරොත්තු නොවූ සිදුවීම් මත ඉලක්කයන් සාක්ෂාත් කර ගත නොහැකි විය.

(ඇ) පිළිගනිමු. මෙම කරුණු 2018වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ඇතුලත් කර ඇත.

<u>4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය</u>

(අ) පිළිගනිමු.

(ආ) මේ වන විට කන්කසන්තුරේ පිහිටි ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් සිමෙන්ති කම්හල ක්‍රියාත්මක නොවන බැවින් ඉදිරි තීරණයක් ගන්නා තුරු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති උපදෙස් අනුව ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සිදු කරනු ලැබේ.

(ඇ) පිළිගනිමු. ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කල ආයතන සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති උපදෙස් හා සම්පත්වල පැවති අඩුපාඩු සැලකිල්ලට ගනිමින් සිමෙන්ති ආනයනය කර විකිණීම් කටයුතු නවතා දමා ඇත.

(ඈ) පිළිගනිමු.

<u>4.2 කළමණාකරණ කියාකාරකම්</u>

(අ) බැංකු ජංගම ගිණුමක පවතින රු.1,548,089/- ක වෙනස 2008 වර්ෂයට පෙර සිටම ඉදිරියට එනු ලබන වෙනසකි. 2008 වර්ෂයට පෙර වර්ෂ වල ගිණුම් පොත්පත් පරීක්ෂා කර බලා මෙය නිවරැදි කල යුතු වේ. ඊට අදාල කටයුතු සිදු කරනු ලැබේ.

පෙර පිටුව ....

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම.

(ආ) මෙම ගෙවිය යුතු බැංකු ණය හා පොළී ගෙවීම සම්බන්ධව 2017 වර්ෂයේදී කුලී ආදායම් ලද දින සිටම බැංකුව සමග සාකාච්ජා සිදු කල අතර ඒ සම්බන්ධව එකගතා හා අදාළ අනුමැතීන් ලද විගස පියවීමට හැකි වූ ණය මුදල හා ණය පොලී ගෙවා පියවන ලදී. එම කුලී ආදායම් ලද විගස බැංකුවේ තැම්පත් කර ඊට රු.1,549,315/-ක පොළී ආදායමක් උපයා ගැනීමට කටයුතු කර ඇත.

එසේම, ආයතනය විසින් කල යුතු අනිවාර්ය ගෙවීම් නිසිපරිදි සිදු කල යුතු බැවින් බැංකුව සමග සාකාච්ජා කර සංස්ථාවට ගෙවීම් කලහැකි සැලසුමක් අනුව බැංකු ණය ගෙවීමට කටයුතු සිදු කරනු ලැබේ.

(ඇ) ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වෙළඳ පොළේ විකිණීම සම්බන්ධව එහි සභාපතිතුමාගේ ලිපි සමග ඊට අදාළ උපදෙස් ලබාදෙන ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් 2017.07.26 දින ලිපියක් මගින් ඉල්ලා ඇත.

එසේම, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලංකා සිමෙන්ති සමාගම වසාදැමීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇත.

4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජන වත්කම්

(අ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි ඉඩම් සඳහා ගෙපත් ලේඛන සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කල පිඹුරුපත් සංස්ථාව සතු වන අතර ඒවා විගණනයට ඉදිරිපත් කරන ලදි.

මෙම ඉඩම සහ ගොඩනැගිලි සංස්ථාව වෙත මුදා හරින ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හරහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

(ආ) පිළිගනිමු.

මෙම ඉඩම සඳහා සුදුසු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේන් ඉල්ලීම් කර ඇත.

(ඇ) පිළිගනිමු. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු ප්‍රයෝජනයට නොගනු ලබන ඉඩම් සඳහා සුදුසු සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීමට අදාල අයදුම් ලබාගැනීම සඳහා දැන්වීම් නිකුත් කිරිමට හා ඊට අදාලව කමිටු පත් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කටයුතු සිදු කිරීමට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර අතර ඒ පිළිබඳව අනුමැතිය ඉල්ලා ඇත.

4.4 අනාර්ථික ගණුදෙණු

(අ) අපගේ පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගමේ සිමෙන්ති කර්මාන්ත ශාලාව 1990 ජුනි මාසයේ සිට යුධමය වාතාවරණය හේතුවෙන් වසා දමා ඇති බැවින් ආයෝජනයට අදාල ප්‍රතිලාභ නොලද බව නිරීක්ෂණය කරන ලදි.

(ආ) ටෙන්ඩර් පටිපාටි අනුව රාජ්‍ය අංශයෙන් ලද ටෙන්ඩර්වලට අදාළව සිමෙන්ති ඇණවුම් පැවති කාලගුණික තත්වයන් මත සංස්ථාවට නිකුත් නොකිරීම , 2017 වර්ෂයේ අප්‍රේල් හා මැයි මාසවල ඇති වූ අධික වැසි සහිත කාලගුණය, ගංවතුර හා සිමෙන්ති විකිණීම සඳහා පළපුරුදු අලෙවි සේවකයින් නොමැති විම වැනි හේතුන් මත මෙම අලාභය දැරීමට සිදු විය. දැනට සිමෙන්ති ආනයනය කිරීම හා විකිණීම් කටයුතු නවතා දමා ඇත.

පෙර පිටුව ....

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

ස්වේච්ඡා වන්දි යේජනා ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසු සංස්ථාවේ ඉතිරි සේවයන් සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත කිහිප විටකදීම යොමු කර ඇති අතර එය අනුමත කරගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම

(අ) පිළිගනිමු.

මෙම තිරසාර සංවර්ධන අරමුණු වෙත අවධානය යොමු කර ඒවා ලගාකර ගැනීම සඳහා ආයතනය සතු සීමිත සම්පත් ආයතනයේ පැවැත්ම, සේවක පැවැත්ම හා සාමාජීය පැවැත්ම කෙරෙහි කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කර දායක වීමට අදහස් කරනු ලබන අතර පසුවිපරම් සඳහා සුදුසු දර්ශකයන් හඳුනාගැනීම ඉදිරියේදී සිදු කරනු ලැබේ.

(ආ) මීට අදාළ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

6 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පිළිගනිමු.

6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුයුක්ත කර සිටි නිලධාරියාද මේ වන විට ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගොස් ඇති අතර එම අංශය සඳහා වෙනත් නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙසට අප විසින් අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත.

6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.3.1 ප්‍රසම්පාදනයන්

පිළිගනිමු. රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීම මත මෙම තාක්ෂණික අධ්‍යයනය සඳහා අවසර ලබාදුන් අතර ඊට අදාළව කෙටුම්පත් කරන ලද ලිඛිත ගිවිසුම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

6.4 අයවැය පාලනය

2017 වර්ෂයට අදාලව අනුමත කරන ලද අයවැය ලේඛනයේ වූ වෙන්කිරීම ප්‍රමාණවත් නොවූ බැවින් 2017 නොවැම්බර් 27 වන දින පැවති 814 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට නැවත සංශෝධනයක් ඉදිපත් කර එම වෙන්කිරීම් සංශෝධනය කර ඇත.

ඉදිරියේදී අයවැය ලේඛනය තවදුරටත් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පිළිබඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම.

6.5 නොවිසදී ඇති විගණන ඡේද ගණන

(අ) පිළිගනිමු. මෙම ලැබිය යුතු ශේෂ සම්බන්ධව විශේෂ කමිටුවක් පත් කර ඊට අදාල කටයුතු සිදු කරමින් පවතී.

(ආ) මෙම ඉඩම සම්බන්ධව අදාළ නිතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගාල්ල දිස්ත්‍රික් අධිකරණයේ නිතිඥවරියකට බලය පැවරීම 2018.02.13වන දින සිදු කල අතර ඊට අදාළව ඉදිරිපත් කරනසියලු ලිපිලේඛනවල පිටපත් විගණන අංශයට ඉදිරිපත් කර ඇත.

(ඇ) මේ පිළිබඳව 2014 වර්ෂයේ සිට සාකච්ඡා සිදු වූ අතර අදාල පෞද්ගලික සමාගම විසින් බදු මුදල් සංශෝධනය සම්බන්ධව ඔවුන්ගේ යෝජනා 2016 වර්ෂයේදී ඉදිරිපත් කල අතර එවා ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත07/06/2016 දින හා 22/06/2017 දින ඉදිරිපත් කරන ලදි.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් 2018.02.16 දිනැති ලිපිය මගින් ලබා දුන් උපදෙස් මත බදු මුදල් සංශෝධනයට අදාලව හිග මුදල් ගෙවන ලෙස 2018.02.20 හා 2018.03.15දිනයන්හිදී අදාල පෞද්ගලික සමාගමට දැනුම් දෙන ලදි.

නැවත මේ පිළිබද සාකච්ජාවක් කැදවා ඇත.

(ඈ) පිළිගනිමු.

මෙම තෙල් ටැංකිවල අයිතිය සනාථ කර සංස්ථාව විසින් අදාළ ලිපිලේඛන අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇත. එම ආයතන විසින් අයිතිය පිළිගෙන හිග මුදල් ගෙවීම් කිරීමේදී ගිවිසුමකට එළඹීමට කටයුතු කරනු ලැබේ.

7 පද්ධති හා පාලනයන්

(අ) ස්ථාවර වත්කම් පාලනය - ස්ථාවර වත්කම් ලේඛනය සකස්කර විගණනය සඳහා ඉදිරිපත් කල අතර එහි අඩුපාඩු නිවරැදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. 2017 වර්ෂයේදී වත්කම් සමික්ෂණ මණ්ඩල පත්කිරීම නියමිත කාලය තුල සිදු කර ඇත.

(ආ) ගබඩා පාලනය - සිමෙන්ති තොගය සම්බන්ධව ප්‍රථම ගැනුම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය අනුගමනය කරනු ලබන අතර අදාල ලිපිලේඛන නිසි පරිදි පවත්වා ගෙන යන ලදි.

(ඇ) අභ්‍යන්තර පාලනය - මේ සම්බන්ධව අවදානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය - මේ සම්බන්ධව අවදානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) අභ්‍යන්තර විගණනය - ස්වෙච්ජා වන්දි යොජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු පුරප්පාඩු වූ අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙසට අප විසින් අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත.